# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# දසවැනි පාර්ලිමේන්තුව

**(පළමුවැනි සභාවාරය)**

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 250

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ
ස්ථාවර නියෝග අංක 125(5) යටතේ ඉදිරිපත් කරනු ලබන
2025.02.20 දින සිට 2025.05.31 දින දක්වා වූ කාල සීමාව සඳහා

# මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ
# පළමුවැනි වාර්තාව

**ඉදිරිපත් කරන ලද්දේ**
**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති**

**පාර්ලිමේන්තු මන්ත්‍රී**
**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා විසිනි**

2025 අගෝස්තු මස 07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී

**මුද්‍රණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියම කළේ**
**2025 අගොස්තු මස 07 දින**

පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| i | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය | 1 |
| ii | මහජන පෙත්සම් විභාග කිරීම සඳහා මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කිරීම | 3 |
| iii | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය | 3 |
| iv | වර්තමාන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරීත්වය | 3 |
| v | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත 2025.05.31 වන දිනට යොමු කරන ලද පෙත්සම් | 5 |
| vi | කාරක සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ | 7 |
| vii | කාරක සභාවට නිරීක්ෂණය වූ විශේෂ කරුණු | 8 |
| viii | වෙනත් නිරීක්ෂණ | 9 |
| ix | නිර්දේශ | 10 |

# වාර්තාව

## 1. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125(1)[1] අනුව තේරීම්කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් 29 දෙනෙකුගෙන් සැදුම්ලත්[2] මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, පහත සඳහන් මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත වන්නේය.

2025.01.09 දින ගරු කථානායකතුමාගේ නිවේදනය ප්‍රකාරව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා පහත සඳහන් මන්ත්‍රීවරයන් නම් කරන ලදී.

1 ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා, පා.ම., (සභාපති)
2 ගරු අජිත් අගලකඩ මහතා, පා.ම.,
3 ගරු උපුල් කිත්සිරි මහතා, පා.ම.,
4 ගරු අජිත් ගිහාන් මහතා, පා.ම.,
5 ගරු අශෝක ගුණසේන මහතා, පා.ම.,
6 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම.,
7 ගරු නන්දන පත්මකුමාර මහතා, පා.ම.,
8 ගරු නිශාන්ත පෙරේරා මහතා, පා.ම.,
9 ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,
10 ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.,
11 ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය, පා.ම.,
12 ගරු මනෝජ් රාජපක්ෂ මහතා, පා.ම.,
13 ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය, පා.ම.,
14 ගරු මුහම්මද් ෆයිසාල් මහතා, පා.ම.,

2025.03.21 දින ගරු කථානායකතුමාගේ නිවේදනය ප්‍රකාරව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා පහත සඳහන් මන්ත්‍රීවරයන් නම් කරන ලදී.

15 ගරු උපාලි සමරසිංහ මහතා, පා.ම.,
16 ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.,
17 ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම.,
18 ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම.,
19 ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.,
20 ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.,
21 ගරු වරුණ ලියනගේ මහතා, පා.ම.,
22 ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා, පා.ම.,
23 ගරු චමින්ද ලලිත් කුමාර මහතා, පා.ම.,
24 ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.,
25 ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා, පා.ම.,
26 ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.,
27 ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය, පා.ම.,
28 ගරු ජගත් විතාන මහතා, පා.ම.,

---

[1] 2024.12.06 දින සහ 2025.03.19 දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලද යෝජනා අනුව පිළිවෙලින් කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව 19ක්ද සාමාජික සංඛ්‍යාව 29ක් ද විය.

[2] විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරන සාමාජික මන්ත්‍රීධූරයක පුරප්පාඩුවක් පවතී.

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා 2025 ජනවාරි මස 23 වැනි දින පළමුවරට රැස්වූ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, කාරක සභාවේ සභාපතිධූරයට ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා, පා.ම., යෝජනා හා ස්ථිරත්වයෙන් පත්කරගත් අතර 2025 පෙබරවාරි මස 20 වන දින සිට කරක සභාව වෙත යොමු කරන ලද පෙත්සම් විභාග කිරීම ආරම්භ කරන ලදි.

එසේ රැස්වූ කාරක සභාව, 2025 පෙබරවාරි මස 20 වන දින සිට 2025 මැයි මස 31 වන දිනට කාරක සභා රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර පෙත්සම් 70 ක් විභාග කර ඇත.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් විභාග කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව සිය අවසාන මතය ද අදාළ විභාග කිරීම් අතරතුර නිරීක්ෂණය කරන ලද කරුණු ද **මෙම වාර්තාවේ අන්තර්ගත කර ඇති අතර ස්ථාවර නියෝග 125(6) හා 125(7) අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ගරු කථානායකතුමා වෙත මෙම වාර්තාව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කර සිටියි.**

**ස්ථාවර නියෝග 125(6)** *" වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කළ විට, කථානායකවරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු අදාළ වන යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ සඳහා එම අමාත්‍යවරයාට යවනු ලැබීමට පියවර ගනු ලැබිය යුතු අතර, එම අමාත්‍යවරයා විසින් තම නිරීක්ෂණ සති අටක කාල සීමාවක් ඇතුළත දී කථානායකවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය."*

**ස්ථාවර නියෝග 125(7)** *" අදාළ යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ ලැබීමෙන් අනතුරුව, එම නිරීක්ෂණවල පිටපතක් කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයාට සහ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ මන්ත්‍රීවරයාට යොමු කරනු ලැබිය යුත්තේ ය. ඒ අනුව ලබා දී ඇති පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත් නොවන්නේ නම්, සුදුසු ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය යුතුය. අමාත්‍යවරයා මාසයක් ඇතුළත අවශ්‍ය පරිදි කටයුතු කළ යුතු අතර, එම කාර්ය ඉටු නොකිරීමට කරුණු ලිඛිතව ඉදිරිපත් කර සලකා බලනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කළ යුත්තේ ය. "*

## 2. මහජන පෙත්සම් විභාග කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කිරීම

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30(1) යටතේ මන්ත්‍රීවරයකු විසින් ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කරනු ලබන මහජන පෙත්සම්, ස්ථාවර නියෝගයන්ට අනුකූල වන්නේ නම් ගරු කථානායකතුමාගේ අනුමතිය සහිතව අදාල පෙත්සම පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට මන්ත්‍රීවරයාට අවසර ලබාදෙන අතර, එසේ පිළිගන්වනු ලබන පෙත්සම් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30(10) යටතේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලබයි.

## 3. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 (2) යටතේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් සලකා බැලීම කාරක සභාවේ කාර්යය විය යුතු අතර, ස්ථාවර නියෝග 125 (3) හි දක්වා ඇති පරිදි රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක නිලධරයකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීමක් හෝ වෙනත් යම් අසාධාරණයක් යම් පෙත්සමක් මගින් අනාවරණය වන බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මතය වන විට, එම පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් විභාග කරනු ලැබීම හෝ එම පෙත්සම විභාග කොට වාර්තා කරනු ලැබීම සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්)වෙත යොමු කරනු ලැබිය හැකිය.

එසේ විභාග කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 125 (4) සහ 125 (5) අනුව කාරක සභාව විසින් සිය මතය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සිදු කරනු ලැබිය යුත්තේය.

## 4. වර්තමාන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරීත්වය

ව්‍යවස්ථාදායකය ලෙස පාර්ලිමේන්තුව වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මඟින් පැවරී ඇති බලතල හා විශ්වාසනීයත්වය සුරක්ෂිත කරමින්, කාරක සභාව වෙත යොමු කරන ලද මහජන පෙත්සම් මඟින් පෙත්සම්කරුවන් විසින් අයැද ඇති සහනය, යම් රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි යම් ආයතනයක නිලධාරියකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් යම් අසාධාරණයක් හේතුවෙන් වන බව දක්වා ඇති විට, පෙත්සම සඳහා ප්‍රස්තුත වන කරුණු සලකා බලා අමාත්‍යාංශය/ආයතනය වෙතින් වාර්තාවක් කැඳවන අතර, එසේ කැඳවන වාර්තාවෙහි උද්ධෘතයක් පෙත්සම්කරු වෙත යොමු කිරීමෙන් පසු පෙත්සම්කරුගේ අදහස් ද ලිඛිතව විමසීමට ලක් කරයි.

අදාල අමාත්‍යාංශය/ආයතනය වෙතින් ලිඛිතව අදහස් කැඳවීමෙන් අනතුරුව පෙත්සම්කරු සහ මූලික අයිතිවාසිකම කඩ කිරීම හෝ වෙනත් යම් අසාධාරණයක් සිදුකළ බවට චෝදනා ලත් අමාත්‍යාංශය/ආයතනය නියෝජනය කරන නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවා පෙත්සම විභාග කිරීම සිදු කරනු ලබයි.

අමාත්‍යාංශ වාර්තාව ඉදිරිපත් කිරීමට කාරක සභාව විසින් සාධාරණ කාලයක් ලබා දෙන අතර, එම වාර්තාව ඉදිරිපත් කිරීමේදී යම් ප්‍රමාදයක් සිදුවුවහොත් පෙත්සම්කරුට සිදුවන අසාධාරණය මඟ හැරවීම සඳහා එම වාර්තාව රහිතව හෝ පෙත්සම සලකා බැලීමට කාරක සභාවට සිදුවන බවද අමාත්‍යාංශ වෙත කාරක සභාව විසින් වාර්තා කැදවීමේදී දැනුම් දී ඇත.

පෙත්සම විභාගය සිදුකරනු ලබන අවස්ථාවෙහි දී ඉදිරිපත් කරුණු ප්‍රමාණවත් නොවන බව කාරක සභාවට නිරීක්ෂණය වූවහොත් පෙත්සම වැඩිදුර විභාග කිරීම් සඳහා කල්තබන අතර ප්‍රමාණවත් තොරතුරු සපයන ලෙස දෙපාර්ශ්වයටම දන්වන අතර එතෙක් සිය මතය කාරක සභාව ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියි.

පෙත්සම්කරුගේ අභිමතය අනුව ඔහු වෙනුවෙන් රැකවරණ නිලධාරියකු හට පෙනී සිටීමට ද කාරක සභාව අවසර ලබා දී ඇති අතර, පෙත්සම්කරු අදාල විභාග කිරීම් දින කාරක සභාව ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වන්නේ නම් පෙත්සම්කරුගේ එකඟතාවය මත ඒකපාර්ශ්විකව පෙත්සම විභාග කිරීම සිදුකරනු ලබයි. පෙත්සම්කරු හට පෞද්ගලිකව ඉදිරිපත් වීමට නොහැකි සාධාරණ හේතුවක් පවතින අවස්ථාවක දී ඔහු වෙනුවෙන් බලය පවරන ලද වෙනත් පුද්ගලයකුට පෙත්සම විභාග කිරීමේදී ඉදිරිපත් වීමට අවසර ලබාදෙනු ලබයි.

පෙත්සම, කාරක සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව විභාග කිරීමට ප්‍රථම හෝ විභාග කිරීම් අතරතුර යම්හෙයකින් පෙත්සම්කරු මියගිය හොත් ඔහුගේ නෛතික නියෝජිතයකු හට පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටීමට ඉල්ලීමක් කළහොත්, කාරක සභාව එසේ ඉදිරිපත් වීමටද අවසර ලබා දී ඇත.

පෙත්සම ඉදිරියට ගෙන යාමට පෙත්සම්කරු නිසි උනන්දුවක් නොදක්වන්නේ නම් සහ විභාග කිරීම් සඳහා කැඳවීම් තුනකට සහභාගීත්වය තහවුරු නොකරන්නේ නම් එම පෙත්සමේ කටයුතු අවසන් කිරීමට කාරක සභාව තීරණය කොට ඇත.

පෙත්සම ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ද පෙත්සම විභාගයට ගනු ලබන අවස්ථාවේදී මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට සහභාගී වීමට අවසර ලබා දෙනු ලබන අතර අදාල විභාග කිරීම නිරීක්ෂණයට පමණක් අවසර ලබා දෙනු ඇත.

පෙත්සම්කරුවන්ගේ පෞද්ගලිකත්වය සුරක්ෂිත වන අන්දමින්, විභාග කිරීම් මාධ්‍යය සඳහා විවෘත නොවන අතර පෙත්සම් හි අන්තර්ගත සියළු කරුණු ප්‍රසිද්ධ නොකිරීමටද කාරක සභාව

තීරණය කර ඇත.

පෙත්සම විභාග කිරීමේ දී පෙත්සම්කරු අසාධාරණයකට ලක් වී ඇති බව කාරක සභාවට නිරීක්ෂණය වූ විට ගත යුතු පියවර සම්බන්ධයෙන් සාධාරණ වූ මතයක්, පවතින නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූල වන පරිදි ප්‍රකාශ කිරීම සහ සහන සලසා දීම , මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ප්‍රධාන අරමුණ සේ සලකන අතර ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ජනතාව වෙත රාජ්‍ය යාන්ත්‍රණය බල ගැන්වෙන ආයතන මඟින් සිදුවන අසාධාරණයන් වළක්වාලීම ද, ඉදිරියේදී එවන් අසාධාරණයන් වැළැක්වීම ද රාජ්‍ය ආයතනයන්හි පරිපාලනමය දුර්වලතාවයන්, පවතින නෛතික ප්‍රතිපාදනයන් හි සංශෝධනයන් අවශ්‍යය යැයි කාරක සභාවේ නිරීක්ෂණයට ලක් වූව හොත් එම නිරීක්ෂණ ඉදිරිපත් කිරීම තුලින් ජනතා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමත් කාරක සභාවේ අභිලාෂය කොට සලකයි.

මෙසේ පෙත්සම් විභාග කිරීමේදී කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලබන පොදු නිරීක්ෂණ ද පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට කාරක සභාව තීරණය කරන ලද අතර, ව්‍යවස්ථාදායකය විසින් ඉදිරිපත් කරන ලද කරුණු රාජ්‍ය ආයතන විසින් සැලකිල්ලට ගනිමින් මහජනතාව වෙත වඩාත් සාධාරණ විශිෂ්ඨ සේවාවක් සපයනු ඇතැයි ද කාරක සභාවේ අදහස වේ.

පෙත්සම්කරු විසින් සිදුකරනු ලබන යම්කිසි වැරදි සහගත ක්‍රියාවක්, නොකර හැරීමක් හේතුවෙන් පෙත්සම්කරු ඉල්ලා ඇති සහනය ලබාදීමට නොහැකි බව කාරක සභාවට පෙත්සම විභාග කිරීමේදී නිරීක්ෂණය වූව හොත් හෝ පෙත්සම්කරු විසින් පෙත්සමෙන් දක්වා ඇති පරිදි සැබවින්ම අසාධාරණයකට ලක්වී නොමැති බව කාරක සභාවට නිරීක්ෂණය වූවහොත් කාරක සභාව විසින් අදාල පෙත්සම පිළබඳව ගත යුතු පියවර සම්බන්ධයෙන් සිය මතය ලෙස ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ කිරීම සිදු නොකරන අතර අදාල පෙත්සම ඉවත දැමීම/නිශ්ප්‍රභා කිරීම සිදු කරයි.

## 5. <u>මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත 2025.05.31 වන දිනට ඉදිරිපත් වී ඇති පෙත්සම් සහ කාරක සභාව විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ග</u>

ගරු කථානායකතුමාගේ අනුමතියෙන් පසු මන්ත්‍රීවරයන් විසින් පාර්ලිමේන්තුවේ දී පෙත්සම් පිළිගැන්වීමෙන් අනුතුරුව, 2025.05.31 වන දිනට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද පෙත්සම් සංඛ්‍යාව 385 ක් වේ.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් විමර්ශනය කිරීමක දී පෙත්සම්කරුවන් වෙනුවෙන් අදාල පෙත්සම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට සාධාරණ කාලයක් ලබාදෙනු ලබන අතර පෙත්සම් විභාග කිරීමේදී අනාවරණය වන කරුණු සහ කරුණු ඉදිරිපත් කිරීම්, සලකා බැලීම් සහ යම් ලියකියවිලි, පොත් සහ වෙනත් ලේඛන අවශ්‍යය අවස්ථාවන් හි දී කාරක සභාව විසින් පරීක්ෂා කිරීම් සිදු කරනු ලබන බැවින් පෙත්සමක් විභාග කිරීම සඳහා යම්

ප්‍රමාණවත් කාලයක් ලබා දීමෙන් සහ සියලු මතයන් විශ්ලේෂණාත්මකව සලකා බලා කාරක සභාව විසින් එකඟ වන අවසාන මතය ප්‍රකාශ කිරීමට කාරක සභාවට එක් පෙත්සමක් විභාග කිරීම වෙනුවෙන් රැස්වීමක දී සාධාරණ කාලයක් වැය කිරීමට සිදුවේ.
ඒ අනුව 2025 මැයි මස 09 වැනි සිකුරාදා දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ දී මතු දැක්වෙන කරුණු පිළිබඳව සලකා බලන ලදී.

අ) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත ලැබෙන පෙත්සම් ප්‍රමාණය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගැනීම

ආ) කාරක සභාවට මෙම සියලු පෙත්සම් සලකා බැලීම ප්‍රායෝගිකව දුෂ්කර වීම

ඇ) මෙම පෙත්සම් පිළිබඳ අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 (8)හි දක්වා ඇති ප්‍රතිපාදන අනුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් ම සමන්විත අනු කාරක සභා පත් කිරීම

ඒ අනුව ස්ථාවර නියෝග 125 (8) අනුව මූලික විමර්ශනයක් සිදු කර නිරීක්ෂණ වාර්තාවක් යොමු කරන ලෙස මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් ම සමන්විත අනු කාරක සභා 3ක් පත් කරන ලද අතර පහත සඳහන් සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් යුක්තව එම අනු කාරක සභා ක්‍රියාත්මක වේ.

<u>අනු කාරක සභාව - I</u>

(i) ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, පා.ම., **(සභාපති)**
(ii) ගරු අශෝක ගුණසේන මහතා, පා.ම., සාමාජික
(iii)ගරු අජිත් ගිහාන් මහතා, පා.ම., සාමාජික
(iv)ගරු උපුල් කිත්සිරි මහතා, පා.ම., සාමාජික
(v) ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම., සාමාජික

<u>අනු කාරක සභාව - II</u>

(i) ගරු මනෝජ් රාජපක්ෂ මහතා, පා.ම., **(සභාපති)**
(ii) ගරු නිශාන්ත පෙරේරා මහතා, පා.ම., සාමාජික
(iii)ගරු ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., සාමාජික
(iv)ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය, පා.ම., සාමාජික
(v) ගරු ජගත් විතාන මහතා, පා.ම., සාමාජික

<u>අනු කාරක සභාව - III</u>

(i) ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා, පා.ම., **(සභාපති)**
(ii) ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම., සාමාජික
(iii)ගරු අජිත් අගලකඩ මහතා, පා.ම., සාමාජික
(iv)ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය, පා.ම., සාමාජික

(v) ගරු චමින්ද්‍ර ලලිත් කුමාර මහතා, පා.ම., සාමාජික

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් 2025.05.31 වන දිනට පෙත්සම් විභාග කිරීම සඳහා රැස්වීම් වාර 12 ක් පවත්වා ඇති අතර විමර්ශනය සිදු කරන ලද පෙත්සම් සංඛ්‍යාව 70 ක් වේ.

විභාග කරන ලද එම පෙත්සම් 70 සම්බන්ධයෙන් වූ තොරතුරු, අපේක්ෂිත සහන, කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු සහ කාරක සභාවේ නිර්දේශ - ඇමුණුම I හි දක්වා ඇත.

**6. <u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයට අදාළව පෙත්සම් විභාග කිරීමේදී කාරක සභාව විසින් සම්මත කර ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ</u>**

(i) පාසැල්වල පළමු වසර සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් වන පෙත්සම් පිළිබඳව සලකා නොබැලීම.

(ii) කාරක සභාව විසින් විභාග කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප/නිෂ්ප්‍රභා කරන ලද පෙත්සම් කාරක සභාව විසින් නැවත සලකා බැලිය යුතු යැයි තීරණය කළහොත් හැර සලකා නොබැලීම.

(iii) රාජ්‍ය ප්‍රතිපත්තිවලට පටහැනි කරුණු සම්බන්ධයෙන් වන පෙත්සම් පෙත්සම්කරු කැඳවීමකින් තොරව විමර්ශනය කිරීම.

(iv) පෙත්සම භාර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කාරක සභාවේ සාමාජිකයෙකු නොවන අවස්ථාවක දී එම පෙත්සම සලකා බැලීමට නියමිත දිනය අදාළ මන්ත්‍රීවරයාට දැනුම් දීම සහ විමර්ශන අවස්ථාවේදී සහභාගීවීමට අවසර ලබා දීම

(v) අවුරුදු 15 කට පෙර සිදු වූ සිදුවීමක් සම්බන්ධයෙන් ප්‍රථම වතාවට කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන පෙත්සම් පිළිබඳව කටයුතු නොකිරීම.

(vi) පෙත්සම ඉදිරියට ගෙන යාමට පෙත්සම්කරු උනන්දුවක් නොදක්වන්නේ නම් එම පෙත්සමේ කටයුතු අවසන් කිරීම.

(vii) යම් පෙත්සමක් පිළිබඳව අදාළ අමාත්‍යාංශය වෙතින් කැඳවන වාර්තාව මාස තුනක් ඇතුළත නොලදහොත්, එම පෙත්සම අමාත්‍යාංශ වාර්තාවක් නොමැතිව සලකා බැලීම.

## 7. කාරක සභාවට නිරීක්ෂණය වූ විශේෂ කරුණු

(i) මහජන පෙත්සම් යටතේ රජයේ සේවයේ නියුතු නිලධාරීන් හා විශ්‍රාමික තත්ත්වයට පත්වූ නිලධාරීන්, අසාධාරණයට ලක්වීම් හේතුවෙන් ලැබෙන පෙත්සම් සංඛ්‍යාත්මකව ඉහල යාම කාරක සභාව නිරීක්ෂණය කරන ලදි.

(ii) පෙත්සම් විභාග කිරීමේ දී යම් පෙත්සම්කරුවන් සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය තොරතුරු අඩංගු ලිපි ලේඛන අදාල ආයතන සතුව නොපවතින බව විභාග කිරීම් අතර තුර නිරීක්ෂණය කළ අතර ඒ අනුව රාජ්‍ය ආයතනයන්හි ලිපි ගොනු නඩත්තුව සහ අපහරණය සම්බන්ධයෙන් වඩාත් සැලකිල්ලක් දැක්වීම සුදුසු බව කරක සභාව නිරීක්ෂණය කරන ලදි.

(iii) කාර්යාලීයය ලිපි සඳහා ප්‍රතිචාර දැක්වීමේ දී සිදුවන ප්‍රමාද දෝෂයන් හේතුවෙන් නැවත නිවැරදි කිරීමට ඉතා දුෂ්කර වන අන්දමේ අසාධාරණයන්ට පත්වීම සහ ප්‍රමාණාත්මක සාධාරණයක් පසුව ලබා ගැනීමට අපහසුවීම නිරීක්ෂණය කල අතර නිසි කාලය තුළ අදාල කරුණු සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම්/ක්‍රියා මාර්ග ගැනීම් අමාත්‍යාංශ/ආයතන මඟින් සිදු කළ යුතු බව නිරීක්ෂණය කරන ලදි.

(iv) බඳවා ගැනීමේ පරිපාටීන් හි දී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයන් සිදු කිරීමේදී පැහැදිලිව වෙන් වෙන්ව ලකුණු ලබාදීම් සම්බන්ධයෙන් අනුමත නිර්ණායක විවෘතව/ප්‍රසිද්ධව නොපැවතීම

(v) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් සඳහා අනුගත වීමේදී නිකුත් කරන ලද උපදෙස් පිළිනොපැදීම සහ ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා හා ප්‍රමාදයන් හේතුවෙන් රාජ්‍ය සේවයේ නියුතු සේවකයන් වෙත උසස්වීම් ලබාගැනීමේදී සහ වැටුප් පාරිශ්‍රමික ලබා ගැනීමේදී අසමානතාවයන්ට ලක් වීම (පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් වෙත නිකුත් කරන ලද චක්‍රලේඛ සඳහා නිසි පරිදි අනුගත නොවීම)

(vi) විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන රු.50,000/- කරුණා සහගත දීමනාව ඉහළ නැංවිය යුතු බව කාරක සභාව අදහස් කරයි.

(vii) විවිධ චක්‍රලේඛයන්හි, බඳවා ගැනීම් පරිපාටියන් හි, සුදුසුකම් සඳහන් කිරීමේදී අර්ථ ගැන්වීම් පැහැදිලි නොවන අවස්ථාවන් හි දී කඩිනමින් අදාල ගැටලු නිරාකරණය අමාත්‍යාංශ/ආයතන මට්ටමින් සිදු කළ යුතු බව.

**8. වෙනත් නිරීක්ෂණ**

(i) පෙත්සම් ප්‍රතික්ෂේප විම

පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන පෙත්සම් ස්ථාවර නියෝග 30 හි සඳහන් පරිදි නොවීම හේතුවෙන් පෙත්සම් ප්‍රතික්ශේප වන බැවින් එය අවම කිරීම පිණිස නිවැරදි පෙත්සමක් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍රය (ඇමුණුම -II) පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් මඟින් පෙත්සම්කරුවන් දැනුවත් වීම සුදුසු බව

(ii) **ස්ථාවර නියෝග සංශෝධන සම්බන්ධයෙන් යෝජනා**

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පෙත්සමක් සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 30 (8) වගන්තියෙහි දැක්වෙන පහත ඡේදය;
"සෑම පෙත්සමක් ම එය පිළිගැන්වීමට පෙර මුලින් එය භාර මන්ත්‍රීවරයා විසින් අත්සන් කරනු ලැබ, යටත් පිරිසෙයින් සම්පූර්ණ දින දෙකක්වත් මහ ලේකම්වරයා වෙත තිබෙන සේ එය භාර දෙනු ලැබිය යුත්තේය".

**සංශෝධනය**

"සෑම පෙත්සමක්ම කථානායකවරයාගේ නමට ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයා විසින් අත්සන් කරනු ලැබ, තම නම / නිල මුද්‍රාව ඇතුළත් කර යටත් පිරිසෙයින් සම්පූර්ණ දින දෙකක්වත් මහ ලේකම්වරයා වෙත තිබෙන සේ එය භාර දෙනු ලැබිය යුත්තේය" ලෙස සංශෝධනය විය යුතු බව.

ඇමුණුම I

## 1) නිර්දේශ ලබා දී ඇති පෙත්සම්

## I. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 01 | එස්.එම්. වීරකෝන් බණ්ඩා මහතා COM/PP/2025/17 ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 01/02/03/01/2024 දිනය : 2024.04.03 | අසනීප තත්ත්වයක් හේතුවෙන් දින 3 ක විවේක නිවාඩු ලබා ගියද නියමිත දිනට සේවයට වාර්තා කිරීමට නොහැකිවීම මත නිකුත් කරන ලද සේවය හැරයාමේ නියෝගය ඉවත් කර තමාව නැවත සේවයේ පිහිටුවා, සේවා කාලය සලකා විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | (අ) සක්‍රිය සේවා කාලය වසර 20ක් සහ මාස 11 ක් වන බව<br><br>(ආ) පෙත්සම්කරු විසින් අභියාචනා ඉදිරිපත් කර තිබීම (රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත) | හිඟ වැටුප් හෝ වෙනත් දීමනා රහිතව නැවත සේවයේ පිහිටුවා විශ්‍රාම ගැන්විය යුතු බව නිර්දේශ කරන ලදී. |
| 02 | ආර්.පී.කේ.ඒ.ඩබ්ලිව්. කේ. රණසිංහ COM/PP/2025/22 ගරු නිතිඥ යූ.පී. අබේවික්‍රම මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/21/2022 දිනය : 2022.12.23 | ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් ගේ අංක NPC/GO/NGO/POL.VIC/ 06/27/2016 හා 2018.06.19 දිනැති ලිපිය මගින් 2014.01.13 වන දින සිට සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා උසස්වීම ලබා දෙන ලෙස දැන්වූවද අමාත්‍ය මණ්ඩල නිර්දේශ හා ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිර්දේශය නොසලකා හැර තම තනතුරේ ජොෂ්ඨතාවය 2014.01.13සිට 2016.12.25 දින දක්වා අඩු කර ඇති බවත් සහකාර පොලිස් අධිකාරී තනතුරේ උසස්වීම 2014.01.13 දිනට පෙරදාතම කර ලබාදීමටත්, 2024.01.13 දිනට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස්වීම ලබා දීමටත් කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | අ) එකම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරීන් පිරිසකට උසස්වීම් ලබා දී තවත් පිරිසකට පසුව එළැඹෙන දිනකට උසස්වීම් ලබා දීම තුළින් පසුව එළැඹෙන දිනකට උසස්වීම් ලද නිලධාරීන් හට අසාධාරණයක් සිදු වී ඇති බවට<br><br>(ආ)පොලිස්කොමිෂන් සභාවේ අංක NPC/GO/NGO/POL.VIC /6/27/2016 දරන 2018.06.19 දිනැති ලිපිය ද | පොලිස් කොමිෂන් සභාවේ NPC/GO/NGO/POL.VIC /06/27/2016 හා 2018.06.19 දිනැති ලිපිය අනුව 2014.01.13 දින සිට සහකාර පොලිස් අධිකාරී තනතුර ලබා දීම ද එතැන් සිට ලැබිය යුතු උසස්වීම් අනුරූප දිනයන්ට ලබා දිය යුතු බව ද නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| 03 | අහමදු ජාන් රසූල් ජාන් මහතා COM/PP/2025/241 ගරු. අරුන් හේමචන්ද්‍ර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.09 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/30/2017 | 2011.08.24 වැනි දින පොලිස් මුරපොළෙන් අනවසරයෙන් පිටව ගොස් ඇති බවට චෝදනා නගා ව්‍යාජ අපරාධයකට සම්බන්ධ කරන ලදුව නඩු පවරා සිය රැකියාව අහිමි කර ඇති බවත් නැවත සේවයේ පිහිටුවීම, විශ්‍රාම වැටුප ලබා දීම හෝ වෙනත් සුදුසු සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරු වෙත අපකීර්තිදායක හැසිරීම සහ රාජකාරිය පැහැරහැරීම යන චෝදනා එල්ල වී තිබුණද, ත්‍රිකුණාමලය අධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව අනුව අපකීර්තිදායක හැසිරීම සඳහා පෙත්සම්කරු නිවැරදිකරු වී ඇති බව<br><br>(ආ) පෙත්සම්කරුගේ දීර්ඝ සේවා කාලය තුළ වෙනත් අයහපත් සිදුවීම් වාර්තා වී නොමැති බව | පෙත්සම්කරු හිඟ වැටුප් රහිතව නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ කිරීමට තීරණය කරන ලදි |
| 04 | ආර්.එම්. ජයසුන්දර මහතා COM/PP/2025/23 ගරු. ඊ. එම්. බස්නායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.09 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 01/02/03/21/2023 | නොකළ වරදක් සම්බන්ධව විනය බලධාරියා විසින් විනය නියෝගයක් ලබා දී ඇති බවත් ඒ අනුව වැටුප් වර්ධක 04 ක් විලම්බනය කර රු 30,000 ක මුදලක් අය කරගැනීමට නියෝග කර ඇති බවත් අභියාචනාවෙන් අනතුරුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එය වැටුප් වර්ධක 02 දක්වා අඩු කළ ද, මේ හේතුවෙන් වසර 17 තිස්සේ සැරයන් තනතුරෙහි ම රැඳී සිටින බවත් දැනට බලාත්මකව පවතින දඬුවම් නියෝගය ද සම්පූර්ණයෙන් ඉවත් කර දෙන ලෙසත් ඉල්ලා ඇත. | (අ) විනය පරීක්ෂණය සිදු කිරීමේදී පෙත්සම්කරු වෙත අසාධාරණයක් සිදුව ඇති බව<br><br>(ආ) අදාල සිදුවීම සම්බන්ධයෙන් වෙනත් නිලධාරියකුට විරුද්ධව නඩුවක් පවරා තිබීම | වැටුප් වර්ධක 02 ක් විලම්භනය කරන ලෙස ලබා දී ඇති දඬුවම ඉවත් කරන ලෙස සහ චෝදනාවලින් නිදහස් කිරීමට කාරක සභාව නිර්දේශ කරන ලදි. |
| 05 | ජී.පී. තෙබුලන්දගේ මහත්මිය COM/PP/2025/176 | වසර දෙකක අනුමත කරන ලද වැටුප් රහිත නිවාඩු මත සිට නැවත වසරක වැටුප් | (අ) පෙත්සම්කාරිය විසින් නියමිත කාලය තුළදී සිය විදේශ | (අ)1995.02.25 සිට 1996.11.14 දක්වා කාලය හිඟ වැටුප් |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.09 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/19/2020 | රහිත නිවාඩු අනුමත කරගත් බවත් 1996.02.15 දින නැවත සේවයට වාර්තා කළ ද සේවය අත හැරයාමේ නියෝගය නිකුත් කර ඇති බව දන්වා සේවයට වාර්තා කිරීමට ඉඩ නොදුන් බවත්, අභියාචනය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සේවයේ පිහිටුවා වැටුප් වර්ධකයක් විලම්භනය කරමින් දඩුවම් ලබා දුන් බවත්, පසුව එවකට අධ්‍යක්ෂ - විනය හා කල්ක්‍රියා විසින් වැටුප් වර්ධක 3ක් අත්හිටුවීමට නියෝග කළ බවත් වැටුප් වර්ධක විලම්භනය කිරීමේ දඬුවම ඉවත් කරන ලෙසත්, 1995.02.25 සිට 1996.11.14 දක්වා කාලය සක්‍රිය සේවා කාලයක් ලෙස ගණනය කරන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | නිවාඩුව තවත් වසරකින් දීර්ඝ කර දීමට අදාළ ඉල්ලීම් සිදු කර ඇති බවට පවතින සාක්ෂි ලේඛන<br><br>(ආ) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අධ්‍යක්ෂ - මහජන සම්බන්ධතා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) වෙත යොමු කරන ලද ලිපියේ ලිපි ලේඛනවල සිදු වූ ප්‍රමාද දෝෂයන් හේතුකොටගෙන සේවය අත්හැර යාමේ නියෝග නිකුත් කර ඇති බව සඳහන් කර තිබීම<br>(ඇ)කාර්යාලීය මට්ටමින් නිවාඩු අනුමත කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුවී ඇති බව | රහිතව සක්‍රීය සේවා කාලයක් සේ සලකා කටයුතු කිරීමටත්,<br><br>(ආ) පනවා ඇති වැටුප් වර්ධකයකයක් විලම්භනය කිරීමේ නියෝගය ඉවත් කිරීමටත් කාරක සභාව නිර්දේශ කරන ලදි. |
| | **රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය** | | | |
| 06 | දඩල්ලගේ මුණිදාස මෙන්ඩිස් මහතා COM/PP/2025/02 ගරු රවී කරුණානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : HA/05/07/03/30 | වී අලෙවි මණ්ඩලයේ සේවය නියුතු තමා ඇතුළු පවුල් 07ක් වී අලෙවි මණ්ඩලය වසා දැමීමෙන් පසු නිසි අවසරය ලබා 1972 වර්ෂයේ සිට මෙම නිවාස වල පදිංචිව සිටින බවත් එම නිවාස ලබා දීමට නිසි ක්‍රියාපටිපාටියක් නොතිබූ හෙයින් තමා විසින් 2009.06.23 දිනැතිව පාර්ලිමේන්තු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලද | (අ) හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේත් නිර්දේශය පරිදි පදිංචිකරුවන්ට නිසි ක්‍රමවේදයක් අනුව විකල්ප ඉඩම් ලබාදීම සුදුසු වන බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බව | පෙත්සම්කරු ඇතුළු තෝරාගත් සුදුස්සන්ට, පදිංචිය සඳහා විකල්ප ඉඩම් ලබා දීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | පෙත්සමක් 2015.04.10 දින රැස් වූ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනයෙන් පසු, තමා ඇතුලු පිරිස පදිංචි වී සිටින නිවාස ආශ්‍රිත භූමිය නාගරික සංවර්ධන අධිකාරියේ නගර සැලැස්ම සඳහා යොදාගෙන තිබීම හේතුවෙන් එම නිවාස හා ඉඩම් වෙනුවට නගරයට ආසන්න ප්‍රදේශයක විකල්ප ඉඩම් ලබා දීමට කටයුතු කරන ලෙසට තීන්දුවක් ලබා දුන්න ද, මේ වන විට තමා ඇතුළු පිරිසට ඉඩම් හා නිවාස වල අයිතිය ලබා දීමට වී අලෙවි මණ්ඩලය තීරණය කර ඇති බැවින් කාරක සභාව විසින් දුන් තීන්දුව තමන් ඇතුළු පිරිසට ඉඩම් හා නිවාස වල අයිතිය ලබා ගැනීමට බාධාවක් වී ඇති බවත්, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උක්ත කාරක සභා තීරණය හෙයින් තමන් ඇතුලු පිරිසට ඉඩම් හා නිවාස වල අයිතිය ලබා නොදෙන බවත් පවසන පෙත්සම්කරු 2015.04.10 දින රැස් වූ මහජන පෙත්සම් කාරක සභාව විසින් ලබා දුන් තීන්දුව බල රහිත කරවා තමා ඇතුළු පිරිසට සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | (ආ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ දැනුම්දීම මත, 2008/4 චක්‍රලේඛය අනුව පදිංචිකරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර විකල්ප නේවාසික ඉඩම් ලබාදීමට සුදුස්සන් 08 දෙනෙකු දැනටමත් තෝරාගෙන ඇති බවටත්, පෙත්සම්කරුද ඊට ඇතුළත් වන බව<br><br>(ඇ)නාගරික සංවර්ධන අධිකාරියේ 2023.11.08 දිනැති ලිපියෙන්, මෙම ඉඩම වාණිජමය වශයෙන් වටිනාකමක් සහිත ඉඩමක් බැවින් එම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දී පදිංචිකරුවනට විකල්ප ඉඩම් තෝරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව | |
| 07 | ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. ජී. ටී. බණ්ඩාර විජේරත්න මහතා COM/PP/2025/19 ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක CPC/SPC/28/19/2018 හා 2019.11.20 දිනැති ලිපියෙන් මධ්‍යම පළාත් මෝටර් රථ රියැදුරු සේවයේ III | (අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 හා 02/2020 නිරීක්ෂණය කරන ලදි (ආ) රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය | විවෘත පදනමින් සිදු කරන බඳවා ගැනීම් වලදී ඉහළ ලකුණු ලබා විභාගය සමත්ව එහෙත් පත්වීම නොලැබූ |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : PL/COM/PP/2020/25 | ශ්‍රේණියට (විවෘත තරඟ විභාගයක් මගින්) තෝරාගෙන ඇති බවත් පත්වීම ලිපි ප්‍රදානය කිරීම 2019.11.27 දින සිදුකරන බවත් දන්වා, පසුව පත්වීම ලිපි ප්‍රදානය කිරීම තාවකාලිකව නතර කරන ලද බවත්, පළාත් මෝටර් රථ රියැදුරු III ශ්‍රේණියේ තනතුර ලබාදෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | තීරණයක් බව (ඇ) අදාල ප්‍රතිපත්තිමය තීරණ ලිඛිතව අදාළ ආයතන වෙත දැනුම් දෙන අවස්ථාව වන විට ලිඛිත/ප්‍රයෝගික හා සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම ලබාදීම සඳහා කැඳවීම් ලිපිද නිකුත් කර ඇති බැවින් පෙත්සම්කරු අසාධාරණයට ලක්ව ඇති බව | පෙත්සම්කරුට ප්‍රමුඛතාවය දී කටයුතු කරන ලෙස මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිර්දේශ කරන ලදී. |
| 08 | යූ. ඩබ්ලිව්. ඒ. පියසිරි මහතා COM/PP/2025/48 ගරු නිහාල් ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : PL/613/COM/PP/20t 912384 | තමා 1996.03.15 වන දින සිට කොන්ත්‍රාත් පදනම මත බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට බඳවාගෙන ඇති බවත්, වසර 15 මාස 3 ක සේවා කාලයකින් පසුව 2013.01.01 වන දින කාර්යාල කාර්යය සහායක තනතුරෙහි ස්ථිර කළ බවත්, වයස අවු. 60 සම්පූර්ණ වීම මත 2017.12.05 වන දින සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ බවත් විශ්‍රාම වැටුප් නොලැබී ඇති බැවින් විශ්‍රාම වැටුප ලබා ගැනීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ඇත. | (අ) අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් සේවා කාල තුළදී සේවක අර්ථසාධක අරමුදල (EPF) හෝ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල (PSPF) සඳහා දායකත්වය ලබාදී ඇති බැවින් ස්ථිර සේවයට ඇතුළත් වීමේදී එම සේවා කාලයන් සැලකිල්ලට ගත හැකි වීම<br>(ආ) රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීන්දු | රජය වෙනුවෙන් සේවයක් සපයා ඇති බව සැලකිල්ලට ගෙන රාජ්‍ය සේවකයින් විශ්‍රාම ගැන්වීමේ නීතිරීති වලට පටහැනි නොවන සේ විශ්‍රාම වැටුපක් ලබාදෙන ලෙස කටයුතු සම්පාදනය කරන ලෙස නිර්දේශ කරයි. |
| 09 | රසිකා විභෝදනී රයිගම් බණ්ඩාර මහත්මිය COM/PP/2025/37 ගරු රත්න ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.11 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : IAD/EST/GA15/PP- | 2012 ඔක්තෝබර් මස සිට කළුතර නගර සභාවේ පෙර පාසැල් පාලිකාවක් වශයෙන් සේවයට බැඳුණු බවත්, මේ දක්වා වසර 09ක කාලයක් කළුතර නගර සභා පෙර පාසැල් වල සේවය කරමින් සිටින බවත්, 2013 වසරේදී බස්නාහිර පෙර පාසැල් ප්‍රඥප්තියේ ලියාපදිංචි කිරීමේදී තමාද එහි සුදුසුකම් | (අ) 2012 වසරේ සිට පෙර පාසැල් ගුරුවරියක ලෙස දීර්ඝ කාලයක් සිය සේවය කළුතර මහ නගර සභාව වෙත ලබා දී ඇති බැවින්<br><br>(ආ) කළුතර මහ නගර සභා කාර්ය මණ්ඩලය තුළ පෙර පාසැල් | පෙර පාසල් ගුරු සහායක තනතුර සඳහා පෙත්සම් කාරිය සුදුසුකම් සපුරා ඇත්දැයි නිසි ලෙස පරීක්ෂා කර බලා, එකී සුදුසුකම් සපුරා ඇත්නම් පෙර පාසැල් ගුරු සහයක තනතුරක ස්ථිර පත්වීමක් ලබා දීම සුදුසු බව නිර්දේශ |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | GNRL 2022 | සහිත ගුරුවරියක වශයෙන් ලියාපදිංචි කරන ලද නමුත් තමාගේ සේවය මේ දක්වා ස්ථිර කර නොමැති බවත්, තමාගේ සේවය ස්ථිර කර දෙන ලෙසත් ඉල්ලා සිටී. | සහයක තනතුරු 03ක් සඳහා මේවන විට අනුමැතිය ලැබී ඇති බව | කරන ලදි. |
| 10 | කේ. පී. ඩබ්ලිව්. ජී. ඥානලතා මහත්මිය COM/PP/2025/54 ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.11 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : Pns/P5/01/94 | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට වැ.අ.වි.වැ F/040574 දරන අංකය යටතේ පුස්තකාල සහායිකා තනතුරෙහි ස්ථිර කරන ලද 2007.09.14 දින පටන් වසර 14 කට ආසන්න කාලයක් දායක මුදල් ද අයකරගත් බවත්, ස්ථිර පත්වීමක් ලබන අවස්ථාවේ තම වයස 45 ඉක්මවා තිබුණ ද, ආදේශක තනතුරට පත්කරන අවස්ථාවේ වයස 39 වූ බවත් අහිමි කරන ලද විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය ලබාදෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | වයස අවුරුදු 45 ඉක්මවීමෙන් පසු පත්වීම් ලද පළාත් සභාව වල සේවයේ නියුතු සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම පිණිස 2024 වසරේ දී (2024 අගෝස්තු මස 12 වැනි දින සහ 2024 දෙසැම්බර් මස 23 වැනි දින) ලබා ගත් අමාත්‍ය මණ්ඩලය තීරණයක් ඇති බවත්, එකී තීරණය ප්‍රකාර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.12.30 දිනැතිව සියළු පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට ලිපියක් මගින් දන්වා ඇති බවත්, ඒ අනුව, මධ්‍යම පළාත් සභාවෙන් ඉදිරිපත් කළ නම් ලැයිස්තුවේ 152 වැනියා ලෙස ඇයගේ නම ඉදිරිපත් කර ඇති බව | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පෙත්සම්කාරියට සිය විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන පවතින බැවින් විශ්‍රම වැටුප් හිමිකම නිර්දේශ කරන ලදී. |
| 11 | එච්. එච්. ස්වර්ණා මහත්මිය COM/PP/2025/134 | ප්‍රධාන මාර්ගයට යාබදව පිහිටා ඇති තමාට අයත් ඉඩම, කිසිදු වන්දි | (අ) පෙත්සම්කාරියගේ ඉඩම පිළිබඳව ප්‍රාදේශීය සභාවේ | පෙත්සම්කාරිය විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ගරු(මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.11 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : PL/6/3/5/com/p/2016/735 | ගෙවීමකින් තොරව දෙවරක් මාර්ග සංවර්ධනයට අත්පත් කරගත් බවත්, ඉතිරිව ඇති කුඩා ඉඩම් කොටසේ තමන් කඩ කාමරයක් ඉදිකිරීමට උත්සාහ ගත් බවත්, ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අවසර ලබා ගත්ත ද කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව මගින් කඩ කාමරය සඳහා අවශ්‍ය ගොඩනැල්ල සාදාගැනීමට අවසරය මේ දක්වා ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්, නිර්වන්දි ගිවිසුමක් මත කඩ කාමරය සාදා ගැනීමට මැදිහත්වන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත | තාක්ෂණික සේවා නිලධාරියෙකු (සිවිල්) විසින් ස්ථානීය පරීක්ෂාවක් 2019.09.23 සිදු කර ඇති අතර එම වාර්තාවේ නිරීක්ෂණ<br><br>(ආ) 2014 දී මාර්ග සංවර්ධන අධිකාරිය පැවති නිර්ණායක අනුව නිර්දේශ කලත් වර්තමාන පරාමිතීන්ට පෙත්සම්කාරියගේ ඉඩම අනුකූල නොවන බැවින් ඇයගේ ඉල්ලීම අනුව එම භූමියේ ස්ථිර ඉදිකිරීමක් සඳහා අනුමැතිය ලබා නොදී ඇති බව<br><br>(ඇ) එවකට බී ශ්‍රේණියේ මාර්ගයක් වූ මාතර - හක්මන මාර්ගය පුලුල් කිරීමේ දී මාර්ගය දෙපස ඉඩම් හිමියන්ට වන්දි ගෙවීමක් සිදු නොවූ බවත්, ඔවුනගේ ලිඛිත කැමැත්ත මත සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් පවරාගත් බව | අංක. 12755 දරන තැගි ඔප්පුව පිළිබඳව වාර්තාවක් ලබා දීමට සහ පෙත්සම්කාරියට ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීම සඳහා ලබා දීමට සුදුසු භූමියක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පවතීද යන්න පිළිබඳව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් කැඳවීමට සහ එතෙක් මාර්ග සංවර්ධන අධිකාරියේ හා කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ නිසි අනුමැතීන්ට යටත්ව ඇයගේ ඉඩමේ ජංගම වෙළඳ රථයක් (රෝද සහිත) තබා ගැනීමට පෙත්සම්කාරියට තාවකාලික අවසරක් ලබා දීමට කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 12 | ආරියදාස ගොඩගම මහතා COM/PP/2025/75 ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : PL/7/4/5/2-2024 | ‘මෙත්තා’ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය සතුව පවතින ගොඩනැගිල්ලට යාබදව ඇති නැඳුන් ගස් 03ක් හා ඇලස්ටෝනියා ගසක් හේතුවෙන් ගොඩනැගිල්ලට, දේපල හා මිනිස් ජීවිත වලට අවධානම් තත්ත්වයක් පවතින බැවින් 2019 වසරේ සිට නාගොඩ ප්‍රාදේශීය සභාව දැනුවත් කළ අතර | (අ) අදාල ගොඩනැගිල්ල සමීපයේ පෙත්සම්කරු සඳහන් කළ නැඳුන් ගස් 3ක් සහ උස්ව වැඩුනු ඇලස්ටෝනියා (ගිනිකූරු) ගසක් ද පිහිටා ඇති බවට සාක්ෂි පැවතීම<br>(ආ) ගාල්ල නාගොඩ ප්‍රාදේශීය සභාවේ | (අ) දැනට අනවසර ගොඩනැගිල්ලක් ලෙස පවත්වාගෙන යන ‘මෙත්තා’ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය සතු ගොඩනැගිල්ලට ගාල්ල නාගොඩ ප්‍රාදේශීය සභාවේ නිසි අනුමැතිය ලබා ගැනීමට නොපමාව කටයුතු කරන ලෙසත්, මාස දෙකක් (02) තුළ |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | විවිධ අවස්ථා වල ගස් ඉවත් කිරීමට නියෝග කළද ඒවා ක්‍රියාත්මක නොවූ බවත්, 2023.05.23 වන දින පළාත් පාලන කොමසාරිස් විසින් පොලීසියේ සහයද ඇතිව එම ගස් ඉවත් කිරීමට උපදෙස් ලබාදී ඇතත් එයද ක්‍රියාත්මක නොවන බැවින් අදාළ තීරණය ක්‍රියාත්මක කර දෙන ලෙස ඉල්ලා ඇත. | ලේකම් ස්ථානීය පරීක්ෂාවකට 2025.05.09 දින සහභාගී වූ බව<br>(ඇ) ජොෂ්ය පුරවැසි සංවිධානය සතු ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවේ නිසි අනුමැතිය ලබා ගෙන ඉදිකළ ගොඩනැගිල්ලක් නොවන බව<br>(ඇ) අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සඳහා අවශ්‍ය බලතල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 107 (1) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති නමුත් ඒ සඳහා පෙත්සම්කරු විසින් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු බව | ප්‍රාදේශීය සභාවට අදාල ලේඛන ඉදිරිපත් කරන ලෙස<br><br>(ආ) ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සිදු කළ දැනුම් දීම අනුව ගොඩනැල්ලට යාබදව පිහිටා ඇති ගස් කපා ඉවත් කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු බව<br><br>**(ඇ) ගාල්ල නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත** ගොඩනැල්ලට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීමට පෙත්සම්කරු විසින් අදාළ අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සඳහා අවශ්‍ය ඉදිරි පියවර නොපමාව ගැනීමට,<br><br>(ඇ) ගස් කපා ඉවත් කිරීම සඳහා පෙත්සම්කරු විසින් අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ප්‍රමුඛතාවය ලබා දී සිදු කිරීමට .<br>(ඉ) ජොෂ්ය පුරවැසි සංවිධානයක් විසින් ඉදිරිපත් කර ඇති මෙම පෙත්සමට අදාළව කාරක සභාව විසින් සිදු කළ නිර්දේශ/සහන ඉටු කිරීමේ දී ඒ සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී කටයුතු කිරීමට පියවර ගැනීමට අදාළ නිලධාරීන්ට වැඩිදුරට |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | | උපදෙස් ලබා දෙන ලදී. |
| **බලශක්ති අමාත්‍යාංශය** | | | | |
| 13 | බී.ඒ.ජී.පෙරේරා මහතා COM/PP/2025/08 ගරු මහින්ද ජයසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 සහ 2025.04.10 දින වල විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පා/12/පෙත්සම්/2019-02 | අවස්ථා දෙකකදී ලංකා විදුලිබල මණ්ඩලයට සේවය ලබා දී ඇති අතර 2015.11.30 දින විශ්‍රාම ලබා ඇති බවත්, වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කලද විශ්‍රාම වැටුප ලැබී නොමැති බවත්, විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාළ කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | අනු අංක 13 සිට අනු අංක 19 දක්වා වූ ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් පහත නිරීක්ෂණ කාරක සභාව දක්වා සිටියි<br><br>(අ) මීට පෙර වසර ගණනාවක් පුරා අවස්ථා කිහිපයකදී මෙම පෙත්සම් පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවේ විභාග කර ලබා දෙන ලද නිර්දේශයන්ට අදාළ පූර්වාදර්ශද සලකා බලා, ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවය කළ වෙනත් සේවක සේවිකාවන්ට සමාන තත්ත්ව යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කර ඇති බැවින් මණ්ඩලීය පත්‍රිකාවක් ඉදිරිපත් කර මෙම පෙත්සම්කරුවන්ට ද විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීමට කටයුතු කරන ලෙස ලංකා විදුලිබල මණ්ඩල සභාපති වෙත නිර්දේශ කර ඇති බව<br><br>(ආ) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට | අනු අංක 13 සිට අනු අංක 19 දක්වා වූ ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් පහත නිර්දේශ කාරක සභාව දක්වා සිටියි<br><br>(අ) සේවා කාලය ඛණ්ඩනය වී ඇති එහෙත් සමස්ත සේවා කාලය මාස 240ට වැඩි, දැනට විශ්‍රාම වැටුප් නොලබන, පෙත්සම්කරුවන් හත්දෙනා (07) වෙනුවෙන් විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා විදුලිබල මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වයෙන් බලශක්ති අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් යොමු කර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමැතිය ලබාගත යුතු බවට කාරක සභාව විසින් නිර්දේශ කරන අතර ඉදිරියේදී ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සම්බන්ධයෙන් මේ අකාරයේ ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ගතයුතු පියවර සම්බන්ධයෙන් නීතිපති මගින්ද |
| 14 | එඩ්වඩ් ජැන්ස් මහතා COM/PP/2025/13 ගරු ස්ටෙෆ්නි ප්‍රනාන්දු මහත්මිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 සහ 2025.04.10 දින වල විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පා/6/පෙත්සම්-2020-02 | සේවා කාලයන් දෙක ඒකාබද්ධ කල විට වසර 26 කට වඩා වැඩි සේවා කාලයක් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය ලබාදී ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු සේවා කාලයන් ඒකාබද්ධ කර විශ්‍රාම වැටුප් ගෙවන ලද අවස්ථා සඳහා පූර්වදර්ශ ඇති බැවින් තමන්ටද විශ්‍රාම වැටුපක් ලබාදෙන ලෙස ඉල්ලා සිටී. | | |
| 15 | එම්.කේ. ආරියරත්න මහතා COM/PP/2025/35 ගරු රත්න ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 සහ 2025.04.10 දින වල විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පාලන/6/පෙත්සම්/18-15 | 1978 වසරේ දී ලංකා විදුලි බල මණ්ඩලයේ සේවයට බැඳුනු බවත් වසර 8 ක් සහ මාස 8 ක් සේවය කිරීමෙන් පසු දේශපාලන හේතුන් මත ඉල්ලා අස්වූ බවත් 2001 වසරේ දී නැවත සේවයේ පිහිටවූ බවත් වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයෙන් විශ්‍රාම ගත් බවත්, විශ්‍රාම වැටුප් ලබාගැනීමට අවශ්‍ය | | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | සේවා කාලය ගණනය කිරීමේදී අදාළ සේවා කාලයන් දෙක ගණනය නොකිරීමෙන් තමන්ට අසාධාරණයක් සිදුවී ඇති බව පවසන පෙත්සම්කරු තමන්ට විශ්‍රාම වැටුප් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටී. | අනුමැතිය ලබා ගැනීම සඳහා මණ්ඩලීය පත්‍රිකා සකස් කර ඉදිරිපත් කර ඇතත් එම නිර්දේශ ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් රෙගුලාසි වලට පටහැනි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම නිර්දේශය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කර ඇති බව | කරුණු විමසා අවශ්‍ය විධිවිධාන ඇතුළත් කළ යුතු බවද කාරක සභාව විසින් වැඩිදුරටත් නිර්දේශ කරයි. |
| 16 | ඩබ්ලිව්. ඩී. වික්‍රමනායක මහතා COM/PP/2025/122 ගරු කාංචන වැලිපිටිය මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.10 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පා/12/පෙත්සම්-2019-05 | 2003 වර්ෂයේදී තමා ලංකා විදුලි බල මණ්ඩලයෙන් විශ්‍රාම ගත් බවත්, ඒ වන විට තමාට වසර 30 ක පමණ සේවා කාලයක් තිබූ නමුත් මේ දක්වා තමාට හිමි විශ්‍රාම වැටුප ලබාදීමට කටයුතු කර නොමැති බවත් සඳහන් කරන පෙත්සම්කරු තමාට හිමි විශ්‍රාම වැටුප ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. | (ඇ) නීතිය ඉදිරියේ සමානව සැලකීමේ මූලධර්මය පෙත්සම්කරුවන් සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවත් එකම ඉල්ලීමක් සම්බන්ධයෙන් එක් එක් සේවකයන්ට විවිධාකාරයෙන් කටයුතු කර ඇති බව | |
| 17 | කේ.එස්. අතුල මහතා COM/PP/2025/125 ගරු දේවානන්ද සුරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 සහ 2025.04.10 දින වල විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පා/12/පෙත්සම්-2021-03 | වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් අනතුරුව ලංකා විදුලි බල මණ්ඩලයෙන් විශ්‍රාම ගිය බවත්, තමාට විශ්‍රාම වැටුප් හිමිකම ලැබීම සඳහා වසර 20 ක සේවය සම්පූර්ණ වීමට දින 13ක කාලයක් අඩු වූ බවත්, තමාගේ සම්පූර්ණ සේවා කාලය වසර 33 ක් පමණ බැවින් වසර 20ට වැඩි සේවා කාලයක් ඇති අය සඳහා ලබාදෙන විශ්‍රාම වැටුප තමාටද ලබාදෙන ලෙස ඉල්ලා ඇත. | | |
| 18 | කේ. ආර්. පී. දුල්වල මහත්මිය COM/PP/2025/143 | 1985.03.11 දින ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයට බැඳී සේවය කළ | | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 සහ 2025.04.10 දින වල විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පාලන/6/පෙත්සම් /2018-08 | බවත්, 2008 වසරේදී සේවයෙන් ඉල්ලා අස්වූ බවත් නැවත සේවයේ පිහිටුවීම සඳහා කරන ලද අභියාචනය සලකා ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2010 වසරේදී නව පත්වීමක් ලෙස සේවය ලබාදුන් බවත්, සේවා කාලයන් ඒකාබද්ධ කොට මුළු සේවා කාලය සලකා විශ්‍රාම වැටුප් හිමිකම හා හිඟ විශ්‍රාම වැටුප් මුදල් ලබා දෙන මෙන් ඉල්ලා සිටියි. | | |
| 19 | බී.ඩී. ගුණසේකර මහතා COM/PP/2025/292 ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.10 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පාලන/6/පෙත්සම් /31 | 2010.10.17 වැනි දින ලංකා විදුලි බල මණ්ඩලයේ විදුලි අධිකාරී තනතුරින් විශ්‍රාම වසර 21ක් පමණ වන සිය මුළු සක්‍රීය සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ඉල්ලුම් කළ ද සිය මුල් සේවා කාලයට අදාළ ලිපි ගොනු සොයා ගත නොහැකි වූ බව පවසමින් විදුලි බල මණ්ඩලය සිය විශ්‍රාම වැටුප අහිමි කර ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු, සේවා කාලයන් ඒකාබද්ධ කොට විශ්‍රාම වැටුප් ගෙවා ඇති බවට පූර්වාදර්ශයන් පවතින බව ද විශ්‍රාම ගිය දින සිට විශ්‍රාම වැටුප් හා හිඟ මුදල් ලබා දෙන ලෙසත්, ඊට ආනුශාංගික වෙනත් දීමනා ඇතොත් ඒවා ද ලබා දෙන ලෙසත් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය** | | | | |
| 20 | එච්. පී. වී. ක්වින්ටස් ජෝර්ජ් මහතා COM/PP/2025/51 ගරු අජිත් අගලකඩ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.03 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : ED/02/29/03/02/429 | උපාධි සුදුසුකම් මත 2008/31 දරන චක්‍රලේඛයේ සඳහන් පරිදි මුද්‍රාහළ ගුරුවරයෙකු ලෙස සලකා උපාධි වැටුප් තලයෙහි පිහිටුවීමට හැකියාව ඇති බැවින් තම සුදුසුකම් මත උපාධි වැටුප් තලයෙහි පිහිටුවීමට කටයුතු කරන මෙන් සහන ඉල්ලා ඇත. | (අ) සෞන්දර්ය අධ්‍යයන ආයතනය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය බවට පත් කරන ලද්දේ 2005.07.01 දින බවත්, සෞන්දර්ය අධ්‍යයන ආයතනය ලෙස පැවැති සමයේ දී පැවැති ගැටළුකාරී තත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් කාල නිර්ණයක් රහිතව ඕනෑම කාලයක් තුළදී අසමත් විෂයන්ට පෙනී සිටීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දී තිබූ බව<br>(ආ) පෙත්සම්කරු අභ්‍යන්තර ශිෂ්‍යයකුව සිට අවසන් වසරේ තමා පෙනී නොසිටි විෂයන් සඳහා පමණක් 2005 වසරේදී පෙනීසිටිමින් තම අභ්‍යන්තර උපාධිය සම්පූර්ණ කරගෙන ඇති හෙයින් සහ ගුරු සේවයට බාධාවක් ඇති නොවන පරිදි උපාධිය සම්පූර්ණ කර ඇති හෙයින් | උපාධි වැටුප් තලයෙහි පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු බවට නිර්දේශ කරන ලදි. |
| **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** | | | | |
| 21 | එම්.ජී.සී. හර්ෂන් විජේරත්න මහතා COM/PP/2025/16 ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, | ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව විසින් මප/ග/ දිවුල්ගස්කොටුව ප්‍රාථමික විදුහල පවත්වාගෙන යෑම සඳහා | (අ) රේඛීය අමාත්‍යාංශය හරහා අදාළ ඉඩම අත්පත් කරගැනීමේ අත්පත් යෝජනාවක් ඉඩම් | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්, ඉඩම් ප්‍රතිසංස්කරණ |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : 2/15/27/204 | අක්කර 02ක ප්‍රමාණයක් 1980 වසරේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලොග් සටහනක් යොදා ලබා දී ඇති නමුත් එය නීත්‍යානුකූලව ලබා දී නොමැති බවත්, පාසල් භූමියේ ප්‍රමාණය දිනෙන් දින අඩුවී ඇති අතර එය නීත්‍යානුකූලව ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කර මෙයට අදාළ සියළු පාර්ශව දැනුවත් කළද මධ්‍යම පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු වාර්තාවක් ලබා දී නොමැති බැවින් සහ ප්‍රස්තුථ ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිත් බැවින් එම කොමිෂන් සභාව හරහා ඉඩම මැන පිඹුරක් හා ඔප්පුවක් සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ඇත. | අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කරන ලෙස දිවුල්ගස්කොටුව ප්‍රාථමික විදුහලේ විදුහල්පතිවරයාට දැනුම් දී ඇති බව<br><br>(ආ) ඉඩම අත්පත් කරගැනීමේ යෝජනාවක් ඉදිරිපත් කර ඇතත්, මේ වන තෙක් ඉදිරි කටයුතු සිදු වී නොමැති බව<br>(ඇ) ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව වෙත ගෙවීමට පළාත් සභාව සතුව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වූ බව<br>(ඈ) රාජ්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතාවයක් නොමැති වීම හේතුවෙන් මෙම ගැටළුව වසර 40කට වඩා වැඩි කාලයක් විසඳුමක් නොලැබ පැවත ඇති බවත්, අනාගත පරපුර වෙනුවෙන් හැකි ඉක්මණින් අදාළ පැවරීම සිදු කළ යුතු බව | කොමිෂන් සභාවේ ලේකම්, මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්, මධ්‍යම පළාතේ පළාත් ඉඩම් කොමසාරිස්, ගලේවෙල ප්‍රාදේශීය ලේකම්, ගලේවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, දිවුල්ගස්කොටුව ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති සහ එම පාසලේ පාසල් සංවර්ධන සමිතිය යන සියළු පාර්ශ්ව, ගලේවෙල ප්‍රාදේශීය ලේකම්ගේ මැදිහත්වීමෙන් සාකච්ඡා කොට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති මෙම ඉඩම, මප/ග/දිවුල්ගස්කොටුව ප්‍රාථමික විද්‍යාලයට අත්පත් කර දීමට අදාළ කටයුතු සම්පූර්ණ කොට අවසන් කළයුතු බවට නිර්දේශ කරන ලදී. |
| 22 | ආර්. කේ. කේ. ඒ. නන්දසිරි මහතා COM/PP/2025/45 ගරු නිහාල් ගලප්පත්ති මහතා, | පදිංචිව සිටින ඉඩමට 1984 වර්ෂයේදී තම මවගේ නමින් බලපත්‍රයක් ලද බවත් එම බලපත්‍රය අස්ථානගතවී ඇති බවත්, 2004 වසරේ සිට තම | (අ) 2023.06.20 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ලබා දුන් නිර්දේශය පරිදි | 2023.06.20 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ලබා දුන් නිර්දේශය පරිදි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.06 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : MOI/AD/05/04ම.පෙ.(01-2022) | දියණියද අදාල ඉඩමෙහි පදිංචි ව සිටින බවත් 2015 වසරේදී නැවතත් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මුරවැසිහේන කොට්ඨාශ කාර්යාලයෙන් විමසීමේදී මෙකී ඉඩම අවලංගු කර, ඒ පිළිබඳ අදාළ ඉඩමේ හා ප්‍රසිද්ධ ස්ථාන වල දැන්වීම් පළ කරන ලද බව පැවසූ බවත් ඉඩමේ කොටසක අනවසරයෙන් වෙනත් පුද්ගලයෙකු නිවසක් ඉදිකරමින් සිටින බවත්, ඒ පිළිබඳ මහවැලි අධිකාරිය දැනුවත් කළද කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත්, එම ඉදිකිරීම නතර කරන ලෙස පොලීසිය දැනුවත් කිරීම මගින් නියෝග ලබා දුන්නද මෙතෙක් එය නතර කර නොමැති බවත් සඳහන් කරමින් තම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තමා වෙත හිමි කර දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු විසින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | කටයුතු සිදු කෙරෙමින් පවතින බවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් විසින් ඉදිරිපත් කළ කරුණු | කටයුතු කර පෙත්සම්කරුට අයත් පර්චස් 67ක ප්‍රමාණය මැනුම් කටයුතු සිදුකර බලපත්‍රයක් නිකුත් කිරීමට කටුයතු කළ යුතු බවට නිර්දේශ කරන ලදි. |
| 23 | එච්.එම්.යූ. හේරත් බංඩාර මහතා COM/PP/2025/10 ගරු කෝසල නුවන් ජයවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.06 දින විමර්ශනය කරන ලදි. | පියාට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගල්මැටියාව ග්‍රාමයේ ගොඩ ඉඩම් අක්කර දෙකක් සහ කුඹුරු ඉඩම් අක්කර තුනක් තිබූ බවත්, යුද සමයේ එම ප්‍රදේශයේ ජීවත් වීමට නොහැකි වූ බැවින් තමන් ජීවත්ව වූ නිවස හැර දමා අවිස්සාවේල්ල ප්‍රදේශයට තම දෙමාපියන්ද සමග පදිංචියට පැමිණි | (අ) 2022.03.08 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ලබා දුන් නිර්දේශය | 2022.03.08 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ලබා දුන් නිර්දේශය පරිදි කටයුතු කරමින් පෙත්සම්කරු වෙත අක්කර 01 පර්චස් 140 ක ගොඩ ඉඩම සහ කුඹුරු ඉඩම කඩිනමින් පෙත්සම්කරු වෙත ලබා දීමට නිර්දේශ |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | බවත්, යුද්ධය අවසන් වූ පසු තමා හට උරුම ගල්මැටියාව ග්‍රාමයෙහි පවතින ඉඩමෙහි පදිංචියට යාම සඳහා තඹලගමුව ප්‍රාදේශීය ලේකම් වෙතින් ලිඛිතව අවසර ඉල්ලා සිටි බවත්, එහෙත් නැගෙනහිර පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරයා විසින් තම ඉඩම තහනම් කර ඇති බවත්, එම ඉඩමේ භුක්තිය වෙනත් අයෙකුට පවරා ඇති අතර ඔවුන් විසින් එම ඉඩම් පරිහරණය කරන බවත් සඳහන් කර ඇති පෙත්සම්කරු, තම පියාගෙන් උරුම වූ ඉඩම් තමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. | | කරන ලදි. |
| 24 | එම්. පී. ගුණරත්න මහතා COM/PP/2025/57 ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.06 දින විමර්ශනය කරන ලදි. | මාවතගම ගොවිජන සේවා කාරක සභාවේ අනියම් කම්කරු තනතුරට 1985.06.10 දින සිට පත්කළ බවත්, 2014.10.24 දින සිට කම්කරු (III ශ්‍රේණිය) තනතුරෙහි ස්ථිර කළ බවත්, අනියම් පදනමින් සේවය කළ කාලය නොසලකා හැර ස්ථිර පත්වීම ප්‍රදානය කර ඇති බැවින් විශ්‍රාම වැටුප අහිමි වූ බවත්, මේ සම්බන්ධයෙන් සලකා බලා තමා හට විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටී. | (අ) මේ සම්බන්ධව 2023.08.22 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ<br>(ආ) ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තත්වය ප්‍රදානය කිරීම 25/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ සිදු කර තිබුණද, මෙම සේවක පිරිස 25/2014 චක්‍රලේඛයේ සඳහන් සේවා ගණයන්ට අයත් නොවීම<br>(ඇ) මෙම තත්වයට මුහුණපා සිටින සේවකයන් විශාල සංඛ්‍යාවක් සිටීම | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ මෙම තත්වයට මුහුණපා සිටින සේවකයන් විශාල සංඛ්‍යාවක් සිටීම හේතුවෙන් එම සියළුම සේවකයන්ට බලපාන පරිදි ඔවුන්ගේ අනියම් පදනම මත වූ පූර්ව සේවා කාලය එකතු කර විශ්‍රාම වැටුප හිමිගැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කොට එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බවට |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | | කාරක සභාව නිර්දේශ කරයි. |
| 25 | ජී.එල්. පියසේන මහතා COM/PP/2025/25 ගරු සංජීව රණසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.06 දින විමර්ශනය කරන ලදි. | උරුමයෙන් තමන්ට හිමි වූ අ.ග.පි. 109 මීගහතැන්න දරන රජයේ ඉඩමෙන් කොටසක්, එයට යාබදව ඇති ඉඩමේ හිමිකාරිය වෙත අසාධාරණ ලෙස ලබාදීමට අදාල නිලධාරීන් කටයුතු කරන බැවින්, සාධාරණ පරීක්ෂණයක් පවත්වා එම සම්පූර්ණ ඉඩම තමන් හට ලබාදීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) 2022.11.10 දින රැස්වූ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී විමර්ශනය කර, යාබද ඉඩම වන ප්‍රේමවතී කන්නංගර නැමැත්තියගේ ඉඩම මැන ඉතිරිවන ඉඩම් ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙසට ලද නිර්දේශය ප්‍රකාරව ඉඩම් මැනුම් කරන ලද වාර්තාව<br>(ආ) බී කොටස ලෙස දක්වා ඇති ඉඩම අනවසර භුක්තියකට යටත්ව ඇති බව | අනවසරයෙන් භුක්ති විඳින පර්චස් 33.6ක ප්‍රමාණයෙන් යුත් “බී” කොටස රජයට (ප්‍රාදේශීය ලේකම් වෙත) පවරාගෙන ගැනුම් මිල අනුව පෙත්සම්කරු වෙත ලබා දීමට කටයුතු කළ යුතු බවට නිර්දේශ කරන ලදි. |
| 26 | එස්.ඒ.එම්. නිලාම් මහතා COM/PP/2025/38 ගරු මුනීර් මුලාෆර් මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.06 දින විමර්ශනය කරන ලදි. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නැවත සේවයේ පිහිටුවා වසර 06 ක් සේවය කර විශ්‍රාම ලැබූ පසු, එය අවිධිමත් පත්වීමක් බව පවසමින් එම කාලය තුළ උපයාගන්නා ලද වැටුප් නැවතත් රජයට අය කර ගත් බවත්, ඊට සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලා 9 වන පාර්ලිමේන්තු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කළ පෙත්සම විභාග කොට තමාට සහන සැලසීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් කැබිනට් පත්‍රිකාවක් ද ඉදිරිපත් කර ඇතත් මේ වන තෙක් විසඳුමක් ලැබී නොමැති බව සඳහන් කර | 2024 ජුනි මස 05 වැනි දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී විමර්ශනය කිරීමෙන් අනතුරුව, පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවමින් ලබා දෙන ලද පත්වීම විධිමත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් හරහා අනුමැතිය ලබා ගන්නා ලෙසත්, එකී අනුමැතිය ප්‍රකාරව ඔහුගේ පූර්ණ සේවා කාලයට නියමිත පූර්ණ විශ්‍රාම වැටුප ලබා ගැනීමට කටයුතු සලසා දෙන ලෙසත් | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව නොපමාව යොමු කරන මෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ කරන ලදි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | ඇති පෙත්සම්කරු තමාගෙන් අයකරගත් මුදල් සහ නියමිත විශ්‍රාම වැටුප ලබාදෙන ලෙස ඉල්ලා ඇත. | ලබා දුන් නිර්දේශය අනුව මේ වන විට ඊට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කර අමාත්‍යවරයාගේ එකඟතාවය සඳහා යොමු කර ඇති බවට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් ඉදිරිපත් කළ කරුණු | |
| **සෞඛ්‍ය අමාත්‍යාංශය** | | | | |
| 27 | එන්.ජී. ප්‍රේමචන්ද්‍ර මහතා OMB/P/2/4/5483/2023 පෙත්සම්කරු විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ඉදිරිපත් කර ඇත. 2025.03.11 දින විමර්ශනය කරන ලදි. | පෙත්මකරුවන් වන (එන්.ජී. ප්‍රේමචන්ද්‍ර මහතා සහ.එන්. කොට්ටහච්චි මහත්මිය) කළුතර ඖෂධවේදී පාසලෙහි සේවය කර මේ වනවිට විශ්‍රාම ගොස් ඇති බවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක. TA/TUT/GEN/PSM & PARA/II/20180 හා 2020.03.12 දිනැති ලිපිය මඟින් ජොෂ්ඨත්වයෙන් අඩු නිලධාරිනියකට උසස්වීමක් පෙරදාතම් කර, එනම් ඖෂධවේදී ආචාර්ය තනතුර ලබා දීමෙන් තමන්ගේ ජොෂ්ඨත්වයට හානි වූ බවත්, ඉන් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවත් සඳහන් කර ඇති අතර, එබැවින් තමන්ට ද අතීතයට බලපාන ලෙස උසස්වීම් පෙරදාතම් කර ලබා දී ජොෂ්ඨත්වයට සිදුවී ඇති අසාධාරණය ඉවත් කර හිඟ වැටුප් ගෙවීමට කටයුතු සලසා දෙන ලෙස පරිපාලන | (අ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් කාරක සභාවට යොමු කර ඇති වාර්තාව<br><br>(ආ) 1994 වසරේ දී සේවයට එක් වූ යූ.ඩී.ජේ. පෙරේරා මහත්මියහට 2002 වසරේ දී I ශ්‍රේණියට උසස් වීම ලබා දී ඇති බවත්, පසුව එය 1994 වසර දක්වා පසුදාතම් කොට හිඟ වැටුප් ද ගෙවා තිබීමෙන් ඇයට පෙර කළුතර ඖෂධවේදී පාසලෙහි සේවට එක්ව ජොෂ්ඨත්වයෙන් ඉහල සිටි පෙත්සම්කරුවන්ට අසාධාරණයක් සිදු වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරනු ලැබේ | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් පැවැත්වූ පරීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ (ගෙවා ඇති හිඟ වැටුප් නැවත අයකර ගැනීම) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සිදු කළ යුතු බව කාරක සභාව නිර්දේශ කරනු ලැබේ. නිර්දේශ ප්‍රකාරව කටයුතු කිරීම තුළ පෙත්සම්කරුවන්ට සිදු වී ඇති අසාධාරණයට සාධාරණයක් ඉටු වන බව පෙනී යන බැවින් පෙත්සම්කරුවන්ට හිඟ වැටුප් ගෙවීමේ අවශ්‍යතාවයක් ද පැන නොනගින බවද කාරක සභාව වැඩිදුරටත් නිරීක්ෂණය කළ අතර පෙත්සම්කරුවන්ද හිඟ වැටුප් අපේක්ෂා |
| 28 | ඩී.එන්. කොට්ටහච්චි මහත්මිය OMB/P/2/4/5483/2023 පෙත්සම්කාරිය විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ඉදිරිපත් කර ඇත. 2025.03.11 දින විමර්ශනය කරන ලදි. | | | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත 2023.06.15 දින මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | | නොකරන බැව් මෙහිදී කාරක සභාවට සඳහන් කරන ලදී |
| 29 | එස්. එම්. පියතිස්ස මහතා COM/PP/2025/89 ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.10 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MH/AD/01/06/01/07/2017 | 1977 වසරේ පදවි ශ්‍රීපුර ග්‍රාමීය රෝහලේ සේවය කරමින් සිටි බවත්, රජය විසින් පොදුවේ ගත් තීරණයක් අනුව තමාගේ රැකියාව අහිමි කළ බවත්, 1995 වසරේ බලයට පත් රජය උසස්වීමක් සමඟ සේවා කාලය සහිතව පාර්ලිමේන්තු අනුමැතියකින් නැවත සේවයේ පිහිට වුවත්, මේ වන තෙක් එය නොලැබුණු බවත්, තමාට සාධාරණ වන්දි මුදලක් ලබා දීමට කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටී. | (අ)1977 මහ මැතිවරණයෙන් පසු දේශපාලන හේතූන් මත පීඩාවට පත් රජයේ සේවකයන්ට සහන සැලසීමේ අමාත්‍ය මණ්ඩල තීරණ (අංක/අමප/96/0965/120/088 හා 1996.06.05 දිනැති) අනුව 1977.08.11 දින සිට පෙත්සම්කරු හිඟ වැටුප් රහිතව නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ වී ඇති බව<br>(ආ) අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොවීම තුළින් පෙත්සම්කරු අගතියට පත්වී ඇති බව<br>(ඇ) 2021 දෙසැම්බර් මස 07 වන දින මෙම පෙත්සම විමර්ශනය කර මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ලබා දුන් නිර්දේශ ද ක්‍රියාත්මක වී නොමැති බව | (අ) පෙත්සම්කරුට සාධාරණ වන්දි මුදලක් ලබා දීම සුදුසු වන බවට නිර්දේශ කරන ලදී. සාධාරණ වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන ලෙස නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත දැනුම් දෙන ලෙසත් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යන පාර්ශ්වයන්ද මේ සම්බන්ධව ක්‍රියාත්මක විය යුතු බවත් නිර්දේශ කරයි. |
| **ආරක්ෂක අමාත්‍යාංශය** | | | | |
| 30 | ආර්. කේ. අශෝකා රංජනී මහත්මිය COM/PP/2025/133 | පෙත්සම්කාරියගේ ස්වාමිපුරුෂයා ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 15ක් සේවය | (අ) පෙත්සම මෙයට පෙර අවස්ථාවේදී 2021.11.30 වැනි දින | වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ගරු අජිත්. පී. පෙරේරා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.14 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/DEF/GS/PPC /SLA/58 | කර 2002 දී විශ්‍රාම ලද බවත්, රෝගී තත්වයක් හේතුවෙන් 2005.06.22 දින ජීවිතක්ෂයට පත්වූ බවත්, ඔහුට හිමි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ලබාගැනීමට අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළද නියමිත කාලය පමා වී ඉදිරිපත් කළ බැවින් හිමිකම් නොලැබූ බවත් සඳහන් කරන පෙත්සම්කාරිය මේ පිළිබඳව කාරුණිකව සලකා සිය ස්වාමි පුරුෂයාට හිමි විශ්‍රාම වැටුප ලබාදෙන ලෙස ඉල්ලා සිටියි | සළකා බලන ලද බව (ආ) ත්‍රිවිධ හමුදාවේ ඉල්ලීම්වලට අමතරව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලි න්ද ඉහත පරිදි ප්‍රමාදවී ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් වී ඇති බැවින් එම ඉල්ලීම්ද මේ සඳහා ඇතුළත් විය යුතු බව හා එම තොරතුරු අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලබාගත යුතු බවත් | සඳහා මනාපය පළ කරන ලද මේ වන විට මිය ගොස් ඇති ත්‍රිවිධ හමුදාව ද ඇතුළත්ව අනෙකුත් සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සේවය කරන ලද රාජ්‍ය නිලධාරීන්ගේ කලත්‍රයන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේදී, විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීම සඳහා නියමිත දිනට පසුව, ප්‍රමාදවී ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද වැන්දඹුවන් හා වැන්දඹු පුරුෂයන් පමණක් සළකා, එම පිරිසට පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල වන පරිදි ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඔවුනට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කරන ලදී. |
| 31 | ඩබ්ලිව්.ඒ. චන්ද්‍රසෝම මහතා COM/PP/2025/179 ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම., විසින් | 1996.12.05 දින ශ්‍රී ලංකා නාවික හමුදා දෙපාර්තමේන්තුවේ ආදේශක කම්කරුවෙකු ලෙස සේවයට බැඳුණු බවත්, | (අ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනියම්/ කොන්ත්‍රාත් | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ගනුලබන පියවර පිළිබඳ ප්‍රගතිය සහ ඒ අනුව |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කර ඇත. 2025.03.14 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/ PAC/05/PPC/2022/20 | වසර නවයකට ආසන්න කාලයක් ඉහත තනතුරේ සේවය කිරීමෙන් අනතුරුව 2005.05.01 දින සේවය ස්ථිර කළ බවත් සේවයේ ස්ථිර කරනු ලැබීමෙන් පසුව අවුරුදු 14ක කාලයක් සහ සම්පූර්ණ සේවා කාලය වශයෙන් අවුරුදු 23ක කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2019.12.11 දින සේවයෙන් විශ්‍රාම ගත් බවත්, තම සේවා කාලය තුළ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වූ බවත්, මේ දක්වා තමාට විශ්‍රාම වැටුප් හිමිකම නොලැබුණු බවත් සඳහන් කරන පෙත්සම්කරු, විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | පදනම මත බඳවාගෙන වයස අවුරුදු 45 න් පසුව ස්ථිර පත්වීම් ලබා දෙන ලද සිවිල් සේවකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා ඇතුලත් අමාත්‍ය මණ්ඩල සංදේශය 2025.03.14 දිනැති ලිපිය මගින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව | පෙත්සම්කාර ඩබ්. ඒ. චන්ද්‍රසෝම මහතාහට විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම සම්බන්ධයෙන් කාරක සභාව වෙත වාර්තාවක් යොමු කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දෙන ලදි. |
| **මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 32 | එස්. ඒ. ඒ. ප්‍රියන්ත මහතා COM/PP/2025/152 ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.08 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MPS/AD/07/04 | ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සේවය කරන අතරතුර දේශපාලන පළිගැනීමකට ලක්ව සේවයෙන් පහ කළ බවත්, 2018.03.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි ගනු ලැබූ තීරණය අනුව නැවත රැකියාවේ පිහිටවිය යුතු වුව ද එය සිදු නොවූ බවත්, රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සභාපති වෙත 2018.04.26 දින කරනු ලැබූ | | නැවත පූර්වාදර්ශයක් සිදු නොවන පරිදි හිඟ වැටුප් රහිතව නැවත සේවයේ පිහිටුවන ලෙසට කාරක සභාව නිර්දේශ කරන ලදි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | විධානය ක්‍රියාත්මක කරන ලෙසත්, අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තමා හිඟ වැටුප් සහිතව සේවයේ පිහිටුවන ලෙසත්, පූර්ණ සේවා කාලය සැලකිල්ලට ගෙන තමා හට හිමිවිය යුතු උසස්වීම් නිසි පරිදි ලබාදීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ඉල්ලා සිටී. | | |
| **ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය** | | | | |
| 33 | පී.එම්. ජයන්ත මහතා COM/PP/2025/88 ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.22 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MT/10/1/3/PP/2023/ 1161 දිනය : 2023.09.06 | 2000.05.02 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි සේවයට බැඳී කතරගම ඩිපෝවේ කොන්දොස්තරවරයෙක් ලෙස සේවය කළ බවත්, සිදුවූ බහින් බස්වීමකට අදාළව තමා ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට 2019.08.08 දින චෝදනා පත්‍රයක් නිකුත් කර විනය විභාගයක් පවත්වා තමාටත් රියදුරු මහතාටත් විනය නියෝගයක් ලෙසට සතියක වැටුප් හා සමාන දඩයක් සහ ස්ථාන මාරුවීමක් දුන් බවත්, ඉන් තමාගේ විනය නියෝගය පමණක් ක්‍රියාත්මක වූ බවත් රියදුරු මහතාට විනය නියෝගය ක්‍රියාත්මක නොකළ බවත්, ස්ථාන මාරුවීම ලැබූ අම්බලන්තොට ඩිපෝවේ රාජකාරි කිරීමේ දී තමා හට ලැබිය යුතු වැටුප්, දීමනා, නිවාඩු වැටුප් නොලැබීම සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව සහ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කළ නමුත් සහනයක් නොලද | (අ) පෙත්සම්කරු කතරගම ඩිපෝවේ සේවය කරමින් සිට විනය නියෝගයකින් අම්බලන්තොට ඩිපෝවට ස්ථාන මාරුවක් ලබා දැනට අම්බලන්තොට ඩිපෝවේ සේවය කරමින් සිටින බව (ආ) එක් කරුණක් සම්බන්ධයෙන් බේරුම්කරණයේ විභාග කටයුතු අවසාන කර තීන්දුව ලබා දීමට නියමිතව ඇති බවත්, අනෙක් කරුණ බේරුම්කරණයේ විභාග වෙමින් පවතින බව | පෙත්සම්කරුගේ පැමිණිලි දැනට බේරුම්කරණයේ විභාග වෙමින් පවතින බැවින් එම කටයුතු කඩිනමින් අවසන් කර එම තීන්දු ප්‍රකාශයට පත් කිරීමට විධිවිධාන සලසා දෙන ලෙස කාරක සභාව කම්කරු කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දෙන ලද අතර එම තීන්දු සම්බන්ධයෙන් කරුණු සලකා බලා මෙම පෙත්සම ඉදිරියේදී වැඩිදුරටත් විභාගයට ගැනීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | බවත් තමාට හිමි වැටුප්, දීමනා සහ උසස්වීම් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. | | |
| 34 | ආර්.එස්.එස්.එච්.එම්. එච්. ධර්මපාල හේරත් මහතා COM/PP/2025/69 ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.22 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MTCA/10/1/3/97 දිනය : 2017.12.26 | දුම්රිය දෙපාර්තමේන්තුවේ වසර 39 ක් සේවය කර විශ්‍රාම ලබා සිටින දුම්රිය ස්ථානාධිපතිවරයෙක් වන බවත්, 2005 සහ 2010 වසරවල සහකාර ප්‍රවාහන අධිකාරී, විමර්ශන නිලධාරී / පරීක්ෂක (ප්‍රවාහන) යන තනතුරු සඳහා ඉල්ලුම් කළ ද, එම අයදුම්පත් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අස්ථානගත කර ඇති බවත්, සහකාර ප්‍රවාහන අධිකාරී තනතුර පෙත්සම්කාර තමන් හට ලබා දීම අමාත්‍ය මණ්ඩලය නිර්දේශ කර ඇති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එය ප්‍රතික්ෂේප කර ඇති බවත්, ඒ හේතුවෙන් අසාධාරණයක් සිදු වී ඇති බව දුම්රිය දෙපාර්තමේන්තුව ද පිළිගෙන ඇති බවත් තමන්ට අනුමත කළ උසස්වීම ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. | (අ)2010 වසරේ දී විමර්ශන නිලධාරී / පරීක්ෂක (ප්‍රවාහන) තනතුර සඳහා යොමු කළ අයදුම්පත අස්ථානගත කර ඇති බවත්, එම අස්ථානගත කිරීම දුම්රිය දෙපාර්තමේන්තුවේ වරදක් වන බව පෙත්සම්කරු ඉදිරිපත් කරුණු<br><br>(ආ) 2010 වසරේ දී විමර්ශන නිලධාරී / පරීක්ෂක (ප්‍රවාහන) තනතුර සඳහා අයදුම් කර ඇති බව<br><br>(ඇ) 2010 වසරේ දී සහකාර ප්‍රවාහන අධිකාරී තනතුර සඳහා අයදුම් කර නොමැති බව | විමර්ශන නිලධාරී / පරීක්ෂක (ප්‍රවාහන) තනතුර සඳහා උසස් වීමක් ලබා දීම සුදුසු බව කාරක සභාව විසින් නිර්දේශ කළ අතර ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී.<br>මෙහි දී පෙත්සම්කරුට අනන්‍ය වන පරිදි තනතුර ලබා දිය යුතු බවත්, මෙම තීරණය අනාගතයේ දී පූර්වාදර්ශයක් නොවිය යුතු බවත් කාරක සභාව විසින් වැඩිදුරටත් නිර්දේශ කරන ලදී. |
| 35 | කේ.ඒ. තාබ්‍රෙව් මහතා COM/PP/2025/76 ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.22 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : AOP/PPC/15/2011 දිනය : 2016.02.18 | දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ ශිල්පියෙකු ලෙස සේවය කරමින් සිටි තමා 2000.03.15 දින කංකානම් තනතුර සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයෙන් ප්‍රථමයා ලෙස සමත් වූ බවද එම තනතුර ලබා නොදුන් බවත්, පරිපාලන අභියාචන විනිශ්චයාධිකරණය මගින් ලබාදුන් නියෝගය ක්‍රියාත්මක කර නොමැති | (අ) පෙත්සම 7 වැනි, 8 වැනි සහ 9 වැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව පෙත්සම්කරුට ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙස අවස්ථා ගණනාවක දී නිර්දේශ ලබා දී ඇති බව<br><br>(ආ) මෙම කරුණ පරිපාලන අභියාචන | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් ලබා දී ඇති තීන්දුව ක්‍රියාත්මක කිරීමට නීතිමය වශයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව බැඳී සිටින බැවින් එම තීන්දුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු යැයි කාරක සභාව |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | බවත් විශ්‍රාමික තමන්ට අදාළ උසස්වීම ලබාදී එයට අනුරූප විශ්‍රාම වැටුප් / හිඟ වැටුප් ලබා දෙන මෙන් ඉල්ලා ඇත. | විනිශ්චය අධිකාරය හමුවට ඉදිරිපත් කරන ලදුව මේ වන විට එම විනිශ්චය අධිකාරය විසින් පෙත්සම්කරුගේ ඉල්ලීම ඉටු කළ යුතු බවට තීන්දුවක් ප්‍රකාශයට පත් කර ඇති බව හා එම තීන්දුව ක්‍රියාත්මක කර නොමැති බව | විසින්ද නිර්දේශ කරන ලදී. මෙම කරුණ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලෙසත් ඒ සඳහා අවශ්‍ය ලිපිලේඛන, තීන්දු පිටපත් සහ නිර්දේශ එම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව විසින් තවදුරටත් නිර්දේශ කරන ලදී. |
| **රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය** | | | | |
| 36 | බී.ජී.ඩබ්ලිව්. ජයසිංහ මහතා COM/PP/2025/21 ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : | නිවසට පිවිසෙන පිවිසුම් මාර්ගය ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව එකී සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකු විසින් පස් පුරවා අවහිර කළ බවත්, ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් එකී ක්‍රියාව සාධාරණීකරණය කිරීමට කටයුතු කිරීමෙන් තමන් අගතියට පත්ව ඇති බවත්, ඒ පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කළ ද තමාට සාධාරණයක් ඉටු නොවූ බවත් සඳහන් කරමින් පෙත්සම්කරු තමාට සාධාරණය ඉටුකර දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුණි. | (අ) මෙය වසර 17ක සිට පැවතෙන ගැටළුවක් බවත් පෙර පැවති කාරක සභා තීරණ වලට අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාවෙන් රු. ලක්ෂ 15ක් වැය කර වතුර බැසීම පිණිස කානුවක් ඉදිකර ඇති බවටත් (ආ) මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු. ලක්ෂ 17ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවටත් (ඇ) පෙත්සම්කරු විසින් මේ සිදුවීමේදී කටයුතු කල ආකාරය | අදාළ පාර්ශවකරුවන් වන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත් පාලන කොමසාරිස්, ගම්පහ දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්, ගම්පහ දිස්ත්‍රික් ඉංජිනේරු සහ දොම්පෙ ප්‍රාදේශීය සභාව යන සියල්ලන්ගේ එකඟත්වයෙන්, පවතින නීතිමය රාමුව තුළ අදාළ පියවර ගෙන, ස්වභාවික ජල බැස්ම සිදුවීමට අවශ්‍ය තාක්ෂණික කරුණුද සලකා බලා, මුදල් ප්‍රතිපාදනද වෙන් කර ඇති බැවින් සහන හිමිකම කාරක සභාව නිර්දේශ කරයි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **බලශක්ති අමාත්‍යාංශය** | | | | |
| 37 | ඩී.කේ. රණසිංහ මහතා COM/PP/2025/04 ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : විබ/පාලන/6/පෙත්සම/2016-13 | ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතිය හේතුවෙන් තම නිවස හා ඉඩම අහිමි වූ බවත් ඒ වෙනුවෙන් නිවසක් හෝ වන්දි මුදලක් නොලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් 2016 සහ 2020 වර්ෂයන්හිදී මහජන පෙත්සම් කාරක සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ අතර එහිදී නිවසක් හෝ වන්දි මුදලක් තමා වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ මේ දක්වාම ඉටුවී නොමැති බැවින් නැවත විමර්ශනයක් සිදුකර තම ගැටළුවට විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | (අ) එම නිවසෙහි පදිංචිව සිටි පද්මනාදන් නමැත්තාට, අහිමි වූ නිවසට විකල්ප නිවසක් ලබා දී ඇති බව හා 2001 වර්ෂයේදී ග්‍රාම නිලධාරී විසින් ඔහුගේ පදිංචිය සනාථ කර ඇති බව<br><br>(ආ)2011 පවත්වා ඇති හිමිකම් පරීක්ෂණයට ඉදිරිපත් වී ඇත්තේද පද්මනාදන් නමැත්තා පමණක් බවටත්, පෙත්සම්කරු ඒ සඳහා ඉදිරිපත් වී නොමැති බව<br>(ඇ) නිලධාරීන්ගේ ප්‍රකාශ වලට පරස්පරව පෙත්සම්කරු දක්වන ලද අදහස්<br><br>(ඈ) ව්‍යවස්ථාපිත වන්දි මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇතත්, එම මුදල භාර ගැනීම පෙත්සම්කරු විසින් ප්‍රතික්ෂේප කර ඇති බව | මෙම ව්‍යාපෘතිය යටතේ අනෙකුත් ඉඩම් සඳහා ලබා දුන් වන්දි මුදල් පිළිබඳව සලකා බලා, පෙත්සම්කරුට සාධාරණ වන්දි මුදලක් ලබා දිය හැකි නම් අදාල මුදල ලබාදෙන ලෙස නිර්දේශ කරන ලදි. |
| **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය** | | | | |
| 38 | එම්. ඒ. විමලසේන මහතා COM/PP/2025/61 | 1999.11.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිසේවක පදනම මත ශ්‍රී | (අ) අදාල පෙත්සම 9 වැනි පාර්ලිමේන්තුවේ දී මහජන පෙත්සම් | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ PSC/EST/02- |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.03 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : ED/4/58/1/8/173/64 | ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ 'සැලසුම්' තනතුරට පත් කරන ලද අතර රාජකාරි භාර ගත් දින සිටම නිත්‍ය සේවක සංඛ්‍යාවට ඇතුළත් කරන ලදුව 2016.06.01 දින සිට අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියට උසස්වීම් ලැබූ බවත්, අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට අතිරේක වැටුප් වර්ධක 04ක් ගෙවීමට තීරණය කළ බව සඳහන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 4/අධ්‍යක්ෂ/ආ/2/09 හා 1995.12.20 දිනැති ලිපියට අනුව එකී වැටුප් වර්ධක 04 ඉල්ලා සිටි බවත්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ අංක 1225/32 හා 2002.03.01 දිනැති ගැසට් නිවේදනය අනුව තමන් අධිසේවක පත්වීම් ලබා තිබීම යන හේතුව මත එය ලබා දීම ප්‍රතික්ෂේප කළ බවත් වැටුප් වර්ධක 04 ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කර ඇති බව<br>(ආ) 1992.12.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාන්තර හා දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ට වැටුප් ගෙවීම සඳහා වන අතර එහි උක්ත සේවා ව්‍යවස්ථා පිළිබඳව සඳහන් නොවන බවත්, උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය යටතේම 2009.06.20 දින සිට අධිසේවක පදනම මත පත්වීම් ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ටද වැටුප් වර්ධක 04ක් ගෙවා ඇති බව සඳහන් කරුණු<br>(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද අංක PSC/EST/02-03/08/2018 හා 2024.12.06 දිනැති ලිපිය මඟින් පෙත්සම්කරු වෙත උක්ත වැටුප් වර්ධක 04 හිමිගැන්වීමට තීරණය කර ඇති බව | 03/08/2018 හා 2024.12.06 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇති සහනය ලැබී ඇති බවද අදාළ තීරණය අනුව කටයුතු කරන ලෙස නිර්දේශ කරන ලදි. |
| 39 | ඩී.ජේ. නිමන්තිකා මහත්මිය COM/PP/2025/53 ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම., විසින් | මධ්‍යම පළාත් සභාවට අයත් පාසල් සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම - 2023 යටතේ ග්‍රැෆික් නිර්මාණකරණය විෂය | (අ) පෙත්සම්කාරියට අසාධාරණයක් වී ඇති බව නිරීක්ෂණය වුවද, ඇයට සහන සැලසීමට අවශ්‍ය නෛතික | (අ) ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ කිරීමට නොහැකි වුවද<br><br>(ආ) සිදු වී ඇති |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කර ඇත. 2025.03.03 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : ED/05/152/05/2024/ 01-33 | සඳහා පැවති ලිඛිත පරීක්ෂණයෙන් පළමු ස්ථානයට පත්වූ නමුත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලද සුදුසුකම් විභාග නිවේදනයෙහි ඉල්ලා ඇති සුදුසුකම්වලට අනනුකූල බව සඳහන්කර සියළු සුදුසුකම් සපුරා සිටි තමාව ඉතාමත් අසාධාරණ අයුරින් ඉවත් කළ බවත් සඳහන් කරමින් හිමිවිය යුතු ගුරු පත්වීම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | ප්‍රතිපාදන සඳහා පහසුකම් නොමැති බව<br>(ආ) බඳවා ගැනීම් සිදුකරන ලද ගැසට් නිවේදනය අවලංගුවී ඇති බව<br>(ඇ) පැවති එකම පූරප්පාඩුව පුරවා ඇති බව | අසාධාරණය පිළිබඳව අවධානය යොමුකර ඉදිරියේදී මධ්‍යම පළාත තුළ ඇතිවන ගුරු පුරප්පාඩු සඳහා සිදු කරනු ලබන බඳවාගැනීමකදී ඇයට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළ යුතු බවත්,<br>(ඇ)මධ්‍යම පළාතේ ගුරු පුරප්පාඩු සඳහා ඉදිරි බඳවාගැනීම් සිදු කිරීමේ දී ප්‍රශ්නගත විෂය සන්ධාරයෙන් 1/3 (credits) තහවුරු කරගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් අනුමත කර ගත යුතු බවටත් කාරක සභාව නිර්දේශ කරයි. |
| **2) සහන හිමිකම නිර්දේශ නොකරන ලද පෙත්සම්** | | | | |
| **බලශක්ති අමාත්‍යාංශය** | | | | |
| 40 | ජේ. බී. මන්තිලක ආරච්චි මහතා COM/PP/2025/196 ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : විබ/පාලන/6/පෙත්සම්/2017-09 දිනය : 2019.06.05 | ලංකා විදුලිබල මණ්ඩලයේ මනු කියවන්නකු ලෙස සේවය කළ තමාගේ රැකියාව කිසිදු සාධාරණ හේතුවකින් තොරව අහිමි කළ බවත්, මේ පිළිබඳව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් පසු පෙත්සම 2007 වසරේදී විභාග කර නැවත කම්කරු හෝ එයට සමාන තනතුරක් ලබා දෙන ලෙසට නිර්දේශ කළ නමුත් එම නිර්දේශය ක්‍රියාත්මක වූයේ 2018 වසරේ බැවින් | (අ) පෙත්සම්කරු හට 1991 වසරේ දී අනියම් පදනම මත දේශපාලන පදනමින් ලබා දී ඇති පත්වීම දේශපාලන බල අධිකාරිය විසින්ම අහෝසි කර ඇති අතර ඉන් පෙත්සම්කරු දේශපාලන පලිගැනීමකට ලක් වී ඇති බව පෙනී යන බව<br><br>(ආ) පෙත්සම්කරුට 2007 වසරේ ලබා දී ඇති මහජන පෙත්සම් | පෙත්සම්කරු ඉල්ලා සිටින අමතර සහන හිමිකම නිර්දේශ නොකරයි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | තමාට අසාධාරණයක් සිදුවී ඇති බව සඳහන් කරන පෙත්සම්කරු නැවත මෙම පෙත්සම විභාග කොට තමාව 2007.03.21 දිනට නැවත සේවයේ පිහිටුවා එදින සිට හිඟ වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් දායකය, සේවා නියුක්තිකයන් භාර අරමුදල් දායකත්වය හා අහිමි කළ වෙනත් සියළු දීමනා සියල්ල ලබා දෙන ලෙස ඉල්ලමින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | පිළිබඳ කාරක සභා නිර්දේශයක් මත පදනම්ව 2016.03.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් සහන සලසා ඇති බව | |
| **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** | | | | |
| 41 | බී.ඩී.ඩී. පෙරේරා මහත්මිය COM/PP/2025/01 ගරු රවී කරුණානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.06 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : | 1995වසරේ සිට සී/ස ලංකා පොහොර සමාගමේ ස්ථිර සේවකයෙකු බවත්, සියළු සුදුසුකම් සපුරා තිබියදීත් තමාට හිමි උසස්වීම් හා නියමිත වැටුප් ලබා නොදුන් බවත්, 2016 වසරේ දී දේශපාලන පලිගැනීම් සිදුවූවන්ට සහන සැලසීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමතිය මත ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක නොවූ බවත්, පසුව 2019 වසරේදී කළමනාකරණ සේවා ගණය (MM 1-2) ලබා දුන් නමුත් නිවැරදි වැටුප් තලය හෝ නිවැරදි තනතුරු නාමය නොලද බැවින් 2015.12.31 දිනට පවතින වැටුප් විශමතාවය ඉවත් කර නිවැරදි වැටුප් ලබා දීම හා 2007 වසරේ සිට වැටුප් ඌණ පූර්ණ දීමනාව ලබා දෙන ලෙසත්, 2018.03.27 | (අ) පෙත්සම්කාරිය වෙත දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන් සඳහා සහන සැළසීමේ කමිටුවෙන් ලබා දුන් නිර්දේශය මත සාධාරණයක් ඉටු වී ඇති බව<br>(ආ) 2019 වර්ෂයේදී ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පූර්ණ අධ්‍යයනයක් සිදු කර 2019.04.28 දිනැතිව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර්තාවක් ලබා දී ඇති අතර එමඟින් පෙත්සම්කාරියගේ වැටුප සැකසීමේදී ගැටළුවක් ඇතිවී නොමැති බව | පෙත්සම්කාරිය විසින් වැඩිමනත් වශයෙන් ඉල්ලා සිටින සහන හිමිකම කාරක සභාව නිර්දේශ නොකරයි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | දින සිට නියෝජ්‍ය මුදල් කළමනාකරු ලෙස (MM 1-2) වැටුප් තලයේ පිහිටුවා ජ්‍යෙෂ්ඨත්වය මත හිමිවිය යුතු වරප්‍රසාද ලබා දීමට හා 2019.07.29 දින සිට මුදල් කළමනාකරු තනතුරට පත් කිරීමටත් අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ඇත. | සමස්ථයක් වශයෙන් එවකට ලක් පොහොර ආයතනයේම වැටුප් වර්ධක ලබාදීමේ ක්‍රමවේදය තුළ ගැටළුවක් ඇති බව නිරීක්ෂණය වන බව සඳහන් කර තිබූ බව | |
| **මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 42 | ප්‍රියන්ත කුමාරගේ මහතා COM/PP/2025/12 ගරු අරුණ පනාගොඩ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/15/2022 දිනය : 2022.11.24 | 2001.12.06 දින සිදුවූ සිදුවීමක් මුල් කොට ගෙන 2002.05.09චෝදනා පත්‍රයක් නිකුත් කර විනය පරීක්ෂණයේදී වැටුප් වර්ධක 2ක් විලම්භනයට ලක් කළ බවත්, උසස්වීම් පරීක්ෂණයන්ට ඉදිරිපත් වීමේ අවස්ථාවන් මඟහැරී ගිය බවද, සේවා කාලය ද සලකා පොලිස් සැරයන් තනතුරින් පසුව හිමිවීමට නියමිත උපපොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහ අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) විනය නියෝගයට පාදක වූ සිදුවීම ද<br><br>(ආ) විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර ඇති බවද<br><br>(ඇ) අදාල සිදුවීම සිදුවී බොහෝ කාලයක් ගත වී ඇති බැවින් ද නියමිත කාලය තුල අභියාචනයක් ඉදිරිපත් කර සාක්ෂි විමසීමේ අවස්ථාව මඟහැර ඇති බැවින්ද | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |
| 43 | ඩබ්ලිව්.එම්. ශාන්ත ගුණතිලක මහතා COM/PP/2025/166 ගරු රෝහණ බණ්ඩාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.09 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/10/2023 | 1997 වසරේ සිට ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ බවත් සේවා කාලය වසර 16ක් සපුරන අවස්ථාවේ දී, පෞද්ගලිකව සිදුකරන වරදකට නඩු පවරා 2011.10.17 රජයේ ගාස්තු ගෙවූ බවත්, තමා සේවයට බැඳෙන අවස්ථාවේ තමාගේ පෞද්ගලික තොරතුරු | මෙම පෙත්සම සම්බන්ධයෙන් සියලු කරුණු සලකා බැලූ කාරක සභාව, පෙත්සම්කරු ඉල්ලා සිටින සහන සැලසීමට අවශ්‍ය ප්‍රතිපාදන කාරක සභාව සතුව නොමැති බව නිරීක්ෂණය කර, මෙම | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | නිශ්කාෂණ වාර්තා මගින් ලබා ගෙන ඇති අතර තමන් සම්බන්ධ තොරතුරු කිසි විටක සඟවා නොමැති බවත්, 2013.08.06 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මේ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන ලදුව පොලිස්පතිතුමාගෙන් තොරතුරු විමසා ඇතත් එයට මෙතෙක් පිළිතුරු යවා නොමැති බවත්, පසුව පොලිස් කොමිෂන් සභාව විසින් ද තම අභියාචනය ප්‍රතික්ෂේප කළ බව දැන්වූ බවත්, තවද 2011.03.03 දින අනුරාධපුර නියෝජ්‍ය පොලිස්පතිතුමා තමා වෙත ලබා දුන් චෝදනා පත්‍රයේ ඇතුළත් චෝදනා දෙකට තමන් වැරදිකරු කර රැකියාව අහිමිකළ හෙයින් මෙම විනය නියෝගය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලා ඇත. | පෙත්සමේ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදී. | |
| 44 | නිමල් සතරසිංහ මහතා<br>COM/PP/2025/174<br>ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත.<br>2025.05.09 දින විමර්ශනය කරන ලදි.<br>අමාත්‍යාංශ යොමුව : 01/02/03/14/2024 | 1985 වසරේ සිට පොලිස් නිලධාරියෙකු ලෙස සේවයට ඇතුලත්ව චෝදනාවකට ලක්ව නඩු පවරා, නඩු තීන්දුව ප්‍රකාරව රු 125,000ක රජයේ ගාස්තු ගෙවා නඩු ව අවසන් වූ බවත්, විධිමත් විනය පරීක්ෂණයක් සිදු නොකර 2022 වසරේ දී සේවයෙන් පහකළ බවත්, තමාගේ සේවය අවසන් කරන විට වයස අවුරුදු 55 සම්පූර්ණ වී ඇති බැවින් තම සේවා කාලය වසර 35ක් පමණ වන බැවින් තමා නැවත සේවයේ | (අ) සිදුවීම පාදක කොට ගෙන දෙනු ලැබූ ස්ථාන මාරුවෙන් පසු පෙත්සම්කරු නොදන්වා සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2020.07.11 දින සිට තනතුර අත හැර යාමේ නියෝග නිකුත් කර ඇති බව<br>(ආ) නඩුවෙහි දී වරද පිළිගෙන ඇති බව<br>(ඇ) විධිමත් විනය පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුරදී අධිකරණ | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | පිහිටුවා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | නියෝගය ලැබීම හේතුවෙන් විනය පරීක්ෂණ ක්‍රියාවලිය අත්හිටුවා අධිකරණ නියෝගය මත පදනම්ව විනය නියෝගයක් නිකුත් කිරීම | |
| 45 | එම්. ඒ. නිශාන්ත කුමාර මහතා COM/PP/2025/146 ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.09 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : 02/03/23/64/2021 | උපසේවා උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස සේවයට එක් වූ බවත්, ගල්කිස්ස පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටියදී තමා රෝගයකින් පීඩා විඳි බවත් 2005.10.11 දිනෙන් පසු තමා හට සේවයට වාර්තා කිරීමට අපහසු වූ බවත්, අදාල දැනුම් දීම් සිදුකලද 2016.06.16 වැනි දින සේවය අත්හිටවන ලද බව දැනුම් දුන් බවත්, අදාළ කරුණ පිළිබඳව කාරුණිකව සළකා බලා නැවත සේවයේ පිහිටුවීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) පෙත්සම්කරු විසින් සඳහන් කරන ලද රෝගය සම්බන්ධයෙන් ප්‍රතිකාර ගැනීමට පොලිස් රෝහල වෙත යොමුව නොමැති බවද<br><br>(ආ) සේවයට වාර්තා කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් පෙත්සම්කරු ඉදිරිපත් කරන ලද කරුණු හි පරස්පරතාවයද | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |
| **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය** | | | | |
| 46 | ඩබ්ලිව්. ඩබ්ලිව්. තමරසිරි මහතා COM/PP/2025/52 ගරු අජන්ත ගම්මැද්දගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.03 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/05/152/05/2024 /01-35 | මාර/පල්ලාවෙල මහා විද්‍යාලයේ උප ගුරුවරයෙකු ලෙස සේවය කළ තමා, 2012.05.02 දින සිට 2015.01.09 දින දක්වා හිටපු බන්ධනාගාර අමාත්‍ය චන්ද්‍රසිරි ගජධීර මහතාගේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ මාධ්‍ය සම්බන්ධීකාරක වශයෙන් සේවය කළ නමුත් එම කාල වකවානුවට අයත් අදාළ වැටුප බන්ධනාගාර අමාත්‍යාංශයෙන් මුලටියන අධ්‍යාපන කලාප කාර්යාලයට ලබාදී නොමැති | (අ) ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2010.05.14 දිනැති ගරු අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩල පත්කිරීමට අදාළ වන රාජ්‍ය වියදම් කළමණාකරන චක්‍රලේඛය මත පදනම්ව අනුමත කාර්ය මණ්ඩලය පත්කරගනු ලැබ ඇති | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | බැවින් මේ වන විට එම මුදල තමාට ප්‍රතිපූරණය කිරීමට සිදුව ඇති බවත් අදාළ මුදල අධිකරණ, බන්ධනාගාර කටුයතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ගෙවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | බව නිරීක්ෂණය වන බවත්, එහි පෙත්සම්කරු සඳහන් කරනු ලබන "මාධ්‍ය සම්බන්ධීකාරක" තනතුරු නාමයක් නොමැති බවත්, ඔහු වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපියක් අමාත්‍යාංශය සතු ලේඛනවල නොමැති බවත්, එම තනතුර සඳහා එවන් පත්වීම් ලිපියක් නොලද බවට පෙත්සම්කරු විසින්ම යොමු කළ ලිපියක් ද ලිපිගොනු අතර වන බවට අධිකරණ අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද කරුණු<br>(ආ) මාධ්‍ය සම්බන්ධීකාරක" තනතුර යැයි අනුමාන කළහැක්කේ මාධ්‍ය ලේකම් තනතුර බවත්, එසේ වුවද එම තනතුර සඳහා ද වැටුප් ගෙවා ඇත්තේ වෙනත් පුද්ගලයකුට වන බවත් අධිකරණ අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද කරුණු<br>(ඇ) පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කළ කාලයට අදාළව ගුරු සේවයෙන් තාවකාලිකව වැටුප් රහිතව මුදාහැරීම සඳහා දකුණු පළාත් | |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා දී ඇති බව<br>(ඈ) ගුරු සේවයෙන් නිදහස් කිරීම සිදු කර ඇතත්, අමාත්‍යවරයාගේ මාධ්‍ය සම්බන්ධීකාරක ලෙස සේවය කිරීම සඳහා විධිමත් පත්වීම් ලිපියක් රහිතව සිදු කරනු ලැබූ බව | |
| 47 | එම්.කේ. එම්. ධර්මසිරි මහත්මිය COM/PP/2025/68 ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.03 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ED/02/29/03/02/424 දිනය: 2022.11.08 | ස්වේච්ඡා ගුරු ස්ථිර පත්වීම් යටතේ රාජ්‍ය සේවයට 1989 දී බඳවා ගත් බවත් වසර 23කට අ.පො.ස (සා. පෙළ) විභාග ප්‍රතිඵල සටහන දෝෂ සහගත යැයි සලකා කිසිඳු දැනුවත් කිරීමකින් තොරව සේවය අත් හිටවූ බවත් වසර 23 ක සේවා කාලය සලකා විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | (අ) බඳවා ගැනීමේ සුදුසුකම්<br><br>(ආ) ඉදිරිපත් කරන ලද විභාග ප්‍රතිඵල ව්‍යාජ බවට විභාග දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර තිබීම | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |
| **රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය** | | | | |
| 48 | නුවන් මුහන්දිරම් මහතා COM/PP/2025/105 ගරු නන්දන පද්මකුමාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : IAD/EST/GA 15/PP-GNRL 2022 | 2003 වර්ෂයේ සිට ගිනි නිවන භටයෙකු වශයෙන් සේවය කළ බවත්, නොවැළැක්විය හැකි හේතූන් මත 2017 අප්‍රේල් මාසයේ සිට සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බවත්, ලිඛිත දැනුම්දීමකින් තොරව සේවය අවසන් කර ඇති බවත් රැකියාව නැවත ලබා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පෙත්සම්කරුට සිය සේවයට වාර්තා කිරීමේ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට ආයතනය මඟින් ලබා දී තිබූ සියළු අවස්ථාවන් ඔහු විසින් පැහැර හැර ඇති බව<br><br>(ආ) සිය රාජකාරී ඉටු කිරීමේ දී වගකීම් විරහිතව කටයුතු කර ඇති බව | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | (ඇ) පෙත්සම්කරු අසාධාරණයකට ලක් කර ඇති බවට පැහැදිලි සාක්ෂි නොවීම | |
| 49 | එස්. ඩබ්ලිව්. තිලකරත්න මහතා COM/PP/2025/158 ගරු තනුර දිසානායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : IAD/EST/GA 15/PP-GNRL 23 | තමාට අයත් මහනුවර, මහයියාව, කටුගස්තොට පාරේ අංක 81/1 දරන දළුක්ගහකොටුව කුඹුරු ඉඩම සඳහා සුදර්ම ධනපාල නොතාරිස්වරයා විසින් ලියා සහතික කළ අංක 110 සහ 1987.11.27 දිනැති ඉඩම් ඔප්පුව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇති බවත්, එම ඉඩම මිලදී ගත් දින සිට තමා විසින් කිසිදු විකිණීමක් හෝ පැවරීමක් කර නොමැති බවත්, එම ඉඩමට අදාළව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A/213/74 දරන පත්තිරුවේ වැරදි සටහනක් තබා ඇති බවත් සඳහන් කරන පෙත්සම්කරු, වැරදි තොරතුරු මත පදනම්ව දමන ලද සටහන නිවැරදි කර දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) පෙත්සම්කරු විසින් සඳහන් කරන උක්ත ඉඩම නූර් නසීමා හෙවත් නුරුල් නසීමා හුසේන් යන අයට අයිතිව තිබී ඇති අතර ඇය විසින් එම ඉඩම පසුව අසීස් මොහොමඩ් කලීල් නමැත්තෙකුට විකුණා ඇති බවත්, පසුව අසීස් මොහොමඩ් කලීල් යන අය විසින් 1987.11.23 දින මෙම ඉඩම පෙත්සම්කරුට විකුණූ බව පෙත්සම්කරු පවසන බව (ආ)1987.11.25 දින නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කරන ලද අංක. 110 දරණ ඔප්පුව දිනපොත් අංක. 22559 හා 1987.11.27 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A 213/74 පත්ඉරුවේ ඉඩම ලියාපදිංචි කර ඇති බව වෙනත් පාර්ශ්වයකට නූර් නසීමා හෙවත් නුරුල් | ඒ අනුව, මෙම සියළු කරුණු පිළිබඳව සලකා බැලීමේ දී, පෙත්සම්කාර තිලකරත්න මහතා තමාට හිමිකමක් නොමැති ඉඩමකට අදාළව මෙම පෙත්සම ඉදිරිපත් කර ඇති බවත්, කාරක සභාවේ දී අනාවරණය වූ කරුණු මත මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරීන්ගෙන් පෙත්සම්කරුට අසාධාරණයක් සිදු වී ඇති බවට කාරක සභාවට නිරීක්ෂණය නොවූ බැවින් ද, ඉල්ලා ඇති සහන හිමිකම නිර්දේශ නොකරයි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | නසීමා හුසේන් යන අය විසින් පර්චස් 10 ක් පවරා ඇති බව<br>(ඇ) බෙදුම් නඩුවක් මහනුවර දිසා අධිකරණයේ පවරා ඇති අතර පෙත්සම්කරු ද එහි පාර්ශ්වකරුවෙකු වන බවත්, තීන්දුව අනුව පෙත්සම්කරුට ඉඩමේ අයිතිය හිමිව නොමැති බව ද දිසා අධිකරණය විසින් ලබා දුන් එම තීන්දුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද 2012.12.07 දින තහවුරු කර ඇති බව | |
| 50 | එම්. විල්මට් පෙරේරා මහතා<br>COM/PP/2025/65<br>ගරු(ආචාර්ය) නන්දන මිල්ලගල මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත.<br>2025.03.11 දින විමර්ශනය කරන ලදි. | පෙත්සම මඟින් දක්වා ඇති බිම් කොටස නිල වශයෙන් තමන්ට භුක්ති විඳීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් මෙම පෙත්සම නිශ්ප්‍රභා කල බව දැනුම් දී ඇත. (2022.12.20 වැනි දින අංක. OMB/P/2/3/3773/2022)<br><br>(ආ)පෙත්සම්කරු පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ගේ වාර්තාව පිළිබඳ සෑහීමකට පත් නොවන බැවින් ආදාළ සියලු පාර්ශ්ව කැඳවා නැවත විභාග කිරීමට කාරක සභාව තීරණය | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | කල අතර<br>(ඇ) පෙත්සම්කරුහට අසාධාරණයක් වී ඇති බවට කාරක සභාවට නිශ්චිතව පැහැදිලි කිරීමට පෙත්සම්කරු අපොහොසත් වීම | |
| **ආරක්ෂක අමාත්‍යාංශය** | | | | |
| 51 | බී.එම්. හැරියට් නෝනා මහත්මිය COM/PP/2025/163 ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.14 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/DEF/14/22/01 /PPC/33 සහ MOD/DEF/GS-S/14/22/01/PPC/33(25) | බී.එම්. ඉන්ද්‍රරත්න (රැකබලා ගත් දරුවා) යුද හමුදාවට බැඳුනු බවත් 1988 වසරේ ජයසිකුරු මෙහෙයුමේ දී අතුරුදන් වූ බවත්, 1977 වසරේ සිට ඔහුගේ භාරකාරත්වය දැරූ බැවින් ඔහු මිය යාමෙන් අනතුරුව වන්දි මුදල් සහ දීමනා 1998 වසරේ සිට 2014 පෙබරවාරි දක්වා තමන් ලද බවත්, ග්‍රාම නිලධාරි විසින් එලෙස ලැබුණු වැටුප දරුවාගේ දෙමාපියන් වෙත ලබාදීමට කටයුතු කර ඇති බවත් සඳහන් කරන පෙත්සම්කාරිය මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා එම වැටුපෙන් අඩක්වත් තමන්ට ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ)පෙත්සම මෙයට පෙර අවස්ථා 2කදී 2022.07.05 වැනි දින සහ 2024.08.06 වැනි දින සලකා බලන ලද බව හා එහි නිර්දේශ අනුව නීති පති උපදෙස් ලැබී ඇති බව<br>(ආ) නීත්‍යානුකූල භාරකරුවන්හට ඔහුට හිමි වැටුප් හා දීමනා ලබා දීමට කටයුතු කරන ලෙස නීතිපතිතුමා විසින් උපදෙස් ලබාදී ඇති බව<br>(ඇ) බී. එම්. ඉන්ද්‍රරත්න සෙබලා යුද්ධ හමුදා සේවයට එක් වීමේ දී ළඟම ඥාතියා ලෙස සෙබලාගේ පියා වන බී.එම් සෝමරත්න යන අය නම්කර ඇති බව | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |
| 52 | එම්.පී. ජයසේකර මහතා COM/PP/2025/104 ගරු නන්දන පද්මකුමාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් | තමා 1991.01.04 දින ශ්‍රී ලංකා යුධ හමුදා නිත්‍ය බලසේනාවට බැඳී 2014.06.14 දින විශ්‍රාම ගිය බවත්, 2003 වර්ෂයේ නාගර් කෝවිල් ඉදිරි ආරක්ෂක වළල්ලේ ඉදිකිරීම් | (අ) පෙත්සම්කරු විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී දුබලතාවයකින් පෙළෙන බව සනාථ කිරීම සඳහා කිසිදු වෛද්‍ය වාර්තාවක් | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | කර ඇත. 2025.03.14 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/PAC/05/PPC/ 2023<br><br>දිනය : 2023.08.21 | කටයුතුවල නිරතවෙමින් සිටියදී ආබාධ තත්වයකට පත් වූ බවත්, 2008 වර්ෂයේදී ආබාධිත තත්ත්වය උත්සන්න වීම නිසා ප්‍රතිකාර කිරීම සඳහා යුධ හමුදා රෝහල වෙත ඇතුළු කර වෛද්‍ය පරීක්ෂණ සිදුකළ බවත්, තමා ආබාධ තත්වයට පත්වූ දින සිට විශ්‍රාම ගිය දින දක්වා වසර 6ක් සේවය කර ඇති බවත්, මේ වන විට ලැබෙන විශ්‍රාම වැටුප ජීවත්වීමට ප්‍රමාණවත් නොවන බැවින් දුබලතා වැටුප සකසා දෙන ලෙස 2016.03.17 දින සිට මේ දක්වා ඉල්ලීම් ඉදිරිපත් කළ ද ඉන් ඵලක් නොවූ බවත්, තමා යුධ හමුදාවේ සේවය කරන කාලය තුළ ආබාධිත තත්වයට පත්වූ බැවින් දුබලතා වැටුප ඉල්ලා ඇත. | ඉදිරිපත් කර නොමැති බව සහ ඒ වන විට යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවූ බවට විශ්‍රාම ලේඛනවල සටහන් වී ඇති බව<br><br>(ආ) විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමේදී ද දුබලතාවයක් තිබූ බවට වන ලියකියවිලි කිසිවක් වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොමැති බව හා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය සතු ලේඛන අනුවද තුවාල සිදුවීමක් සම්බන්ධව සඳහන් වී නොමැති බව<br>(ඇ) පෙත්සම්කරු දුබලතා වැටුපක් හෝ වන්දියක් ලබාදීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව | |
| **බලශක්ති අමාත්‍යාංශය** | | | | |
| 53 | එච්. ජී. මෛත්‍රීසේන මහතා COM/PP/2025/194 ගරු නලින් හේවගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : | පෙත්සම්කරු ඇතුළු සේවක කණ්ඩායමක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කර ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගත් නමුත් තමන් වෙත හිමි විය යුතු හිඟ වැටුප් මේ වන තුරු ද ගෙවා නොමැති බව සඳහන් කරන පෙත්සම්කරු තමන් හට හිමි | (අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දැනුම් දී ඇති පරිදි අදාළ වැටුප් වැඩි වීම අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සේවයේ යෙදී සිටින සේවකයින්ගේ අතිකාල අවමය දක්වා | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ADM/12/05/09<br><br>දිනය : 2024.04.19 | විය යුතු හිඟ වැටුප් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස පෙත්සමෙන් ඉල්ලා ඇත. | කපාහැරීම මගින් වැඩි වන වැටුප් අවරණය කරගැනීමේ කොන්දේසිය මත එවකට සේවයේ යෙදී සිටි සේවක මණ්ඩලයට සිදු කළ වැටුප් වැඩිවීමක් වන බවටත් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය සේවක මණ්ඩලයට මෙම වැටුප් වැඩි වීම අදාළ නොවන බව<br>(ආ) මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දී ඇති බව<br>(ආ) කම්කරු කොමසාරිස් විසින් සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැමිණිලි විභාග කර ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇති බව | |
| **මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 54 | අමාශා නිර්මාණි එදිරිමුණි මෙනෙවිය COM/PP/2025/177 ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.08 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MF1/11/03/12/03/COPP/GEN | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවය කර 2023.09.13 දින වසර 02ක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා සිට 2024.01.04 දින බැංකුව වෙත ඉල්ලා අස් වීම යොමු කළ බවත් තමා වැටුප් රහිත නිවාඩු ලබාගත් කාලය නොසලකා ගිවිසුම්ගතවූ සම්පූර්ණ මුදලම තමාගේ අර්ථසාධක අරමුදලින් ලබා ගන්නා බවට බැංකුව විසින් දැනුම්දුන් බවත්, තමාට හිමි අර්ථසාධක මුදල නිදහස්කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා | (අ) ගිවිසුමෙහි එකඟතාවයන් පෙත්සම්කාරිය විසින් කඩකර ඇති පසුබිමක නැවතත් ලිඛිත ගිවිසුමෙහි එකඟතාවන් වෙනස්කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම සාධාරණ නොවන බව<br>(ආ) විදේශගතව සිට සේවයෙන් ඉල්ලා අස්වූ සියළු දෙන සඳහා එකම ක්‍රමවේදයකට අනුව ඇප බැඳුම්කර | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | ඇත. | අයකරගැනීමට කටයුතු කළ බව | |
| 55 | ගාල්ලගේ ජිනප්‍රිය මහතා COM/PP/2025/31 ගරු රත්න ගමගේ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.08 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MF1/11/03/11/08/COPP/GEN | මහජන බැංකුවේ සේවයේ යෙදී සිටියදී සිදුවූ සිදුවීමක් සම්බන්ධයෙන් දෙන ලද දඬුවම පක්ෂග්‍රාහී තීන්දුවක් බවත්, පළමු සේවා දිගුව බලාපොරොත්තුවෙන් සිටියද සේවය 2015.01.03 දින අවසන් කිරීමට සිදු වූ බවත්, වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකිව තිබූ බවත් වයස අවුරුදු 60 දක්වා සේවයේ යෙදී සිටියේ නම් තමාට හිමි විය යුතු සාමූහික ගිවිසුමට අදාළ වැටුප් වැඩිවීම්, පාරිතෝෂික දීමනා, වාර්ෂික වේතනාධික, නිවාඩු, උසස් වීම් සහ අර්ථසාධක හා භාර අරමුදලෙන් ලබාගත හැකි මුදල් සහ අයවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් ද ලබා දෙන මෙන් ඉල්ලා සිටී. | (අ) පෙත්සම්කරු විසින් දක්වා සිටින ලද සිදුවීම සහ ඊට සම්බන්ධ කරුණු<br>(ආ) ආයතනය විසින් දඬුවම් පැමිණවීම සහ අභියාචනා කිරීමට පෙත්සම්කරු වෙත අවස්ථා ලබා දීම<br>(ඇ) පෙත්සම්කරු අදාල සිදුවීම් සම්බන්ධයෙන් සෘජුව සම්බන්ධ නොවූවද යතුරුභාර නිලධාරියෙකු ලෙස පෙන්වන ලද අපරීක්ෂාකාරී සහ වගකීම් විරහිත ක්‍රියා කලාපය<br>(ඈ) බැංකුව විසින් විශ්‍රාම සේවකයකු වෙත ලබාදෙන සියළු විශ්‍රාම ප්‍රතිලාභ භුක්ති විඳින බව | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |
| 56 | සෙනරත් හෙට්ටිආරච්චි මහතා COM/PP/2025/06 ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.08 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MF1/11/03/11/08/COPP/GEN | මහජන බැංකුවේ වසර 26 ක සේවා කාලයක් ඇති බවත්, 2017 වර්ෂයේ දී පළිගැනීමක් හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීමට සිදුවූ බවත්, සභාපතිවරයා විසින් අදාළ ඉවත් වීම අනුමත කළ බවත් අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවට ඉහත සිදුවීම ඇතුළත් කළ බව තමන්ට දැනුම් දුන් බැවින් සහ සෙසු නිලධාරීන්ගෙන් බැංකුවට එරෙහිව සාක්ෂි ලබා ගත නොහැකි බැවින් අධිකරණයට නොයාමට | (අ) පෙත්සම්කරු සඳහන් කරන පරිදි පෙත්සම්කරුගෙන් පුද්ගලිකව පළිගත් බවට සාක්ෂි තහවුරු නොවන බවත් ඔහු විසින් ඒ සම්බන්ධයෙන් බැංකුවේ කළමණාකාරීත්වයට පැමිණිලි කළ බවට පිළිගත් සාක්ෂි නොමැති බවට<br>(ආ) 2017.06.12 දිනැතිව මහජන | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | තීරණය කළ බවත්, වයස අවුරුදු 55 සම්පූර්ණව ඇති හෙයින් විශ්‍රාම වැටුප ලබා ගැනීම සම්බන්ධයෙන් කළ ඉල්ලීම් බැංකුව විසින් ඉවත දමන ලද බවත් සඳහන් කරන පෙත්සම්කරු, තමන්ට සාධාරණය ඉටු කර දෙන මෙන් ඉල්ලා ඇත. | බැංකුවේ සාමාන්‍යාධිකාරී වෙත ලිපියක් ඉදිරිපත් කරමින් පෙත්සම්කරු විසින් සිය කැමැත්තෙන් විවිධ පෞද්ගලික කරුණු අනුව විශ්‍රාම ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බවත් (ඇ) 2022 දෙසැම්බර් මස සිට මහජන බැංකුවේ විශ්‍රාමිකයකුට හිමි සියළුම ප්‍රතිලාභ ඔහු විසින් භුක්ති විඳින බවටත් කරුණු ඉදිරිපත් විය | |
| **ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය** | | | | |
| 57 | ඩබ්ලිව්.ඒ.ඒ.ඩී. පුෂ්පකුමාර මහතා COM/PP/2025/71 ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.22 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MPS/AD/07/04 දිනය : 2024.05.27 | සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ 1985 වර්ෂයේ සිට සේවය කර විශ්‍රාම ලද තමාට කළමණාකාරීත්වය විසින් අසාධාරණව අහිමි කළ ගිණුම් සහකාර තනතුරට අදාළ උසස්වීම සහ සහකාර ගණකාධිකාරී තනතුරට අදාළ උසස්වීම්, පිළිවෙළින් 1993 සහ 1997 යන වර්ෂයන්හි සිට බලපැවැත්වෙන පරිදි ලබාදී, ඊට අනුරූපව ලැබිය යුතු හිඟ මුදල් ද ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සළසා දෙන මෙන් පෙත්සමෙන් ඉල්ලා ඇත. | (අ) බඳවාගැනීම් සිදුකිරීමේ දී සලකා බලන ලද සුදුසුකම් සහ සලකන ලද ඉහල සුදුසුකම්<br>(ආ) පෙත්සම්කරු සේවයෙන් විශ්‍රාම ලබා ඇති බැවින් ද අතීතයට බලපාන පරිදි උසස්වීම් ලබා දීමට හැකියාවක් නොමැති බවද සී./ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම වෙළඳ ව්‍යාපාරයක් වන බවද | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |
| 58 | එන්.සී.එස්. ප්‍රේමලාල් මෙන්ඩිස් මහතා COM/PP/2025/96 ගරු හෙක්ටර් | 1980.10.25 දින ශ්‍රී ලං.ග.ම. වයඹ ප්‍රාදේශිකයේ වෙන්නප්පුව ඩිපෝවේ ඩිපෝ මාර්ග පරීක්ෂක | (අ) 2024.06.19 දින පැවති 9 වැනි පාර්ලිමේන්තුවේ පෙත්සම් කාරක | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | අප්පුහාමි මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.22 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MT/10/1/3/153 දිනය : 2023.01.25 | තනතුරකට බඳවා ගත් බවත්, වසර 30 ක අඛණ්ඩ සේවා කාලයකින් පසු 2011.02.08 දින වයස අවුරුදු 55 වීම නිසා විශ්‍රාම ගැන්වූ බවත්, තමා 2005 වසරේ සිට 2007 වසර අවසාන වන තෙක් සේවය කළ දින 168 ½ ට නීතිවිරෝධීව හා ශ්‍රී ලං.ග.ම. ව්‍යවස්ථාවට පටහැනිව වැටුප් නොගෙවූ බවත්, මේ සම්බන්ධයෙන් 2017.02.17 දින කුරුණෑගල සහකාර කම්කරු කොමසාරිස්ට පැමිණිලි කළ බවත්, වයස 60 වන තෙක් සේවය කිරීමට ශ්‍රී ලං.ග.ම. සේවකයන්ට අවස්ථාව සලසා දී තිබියදීත් තමා වයස 55 න් බලහත්කාරයෙන් විශ්‍රාම ගැන්වීම පිළිබඳව පුත්තලම සහකාර කම්කරු කොමසාරිස්ට පැමිණිලි කළ බවත් මෙම පැමිණිලි සඳහා තවම විසඳුම් ලැබී නොමැති බැවින් තමාට සහනයක් සලසා දෙන ලෙස පෙත්සමෙන් ඉල්ලා ඇත. | සභාවේද මෙම ඉල්ලීම විමර්ශනයට ලක් කර ඇති බව<br>(ආ) දින 168 ½ ක වැටුප සම්බන්ධයෙන් වූ ඉල්ලීම තහවුරු කිරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම ද දීර්ඝ සහ සවිස්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු වන බවද<br>(ඇ) කම්කරු කොමසාරිස් ජනරාල් විසින් මෙම පෙත්සම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කරුණු වන වයස 60ට පෙර විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් බේරුම්කරණයට යොමුකර තීන්දුවක් ලබා දී ඇති බවත් දින 168 ½ වැටුප සම්බන්ධයෙන් පෙත්සම්කරු ඉල්ලා සිටින්නේ නම් බේරුම්කරණයට යොමුකල හැකි බවත් | කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අංක IR/COM/04/2017/14 සහ 2024.08.16 දිනැති ලිපියේ දක්වා ඇති පරිදි පෙත්සම්කරු හට යම් කිසි ආකාරයකින් අභියාචනාධිකරණයට හෝ බේරුම්කරණයකට යොමු වීමට මෙම තීන්දුවෙන් බාධාවක් නොවන බව ද |
| **සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය** | | | | |
| 59 | එච්.ඩී. රන්ජන් මහතා COM/PP/2025/90 ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.10 දින විමර්ශනය කරන ලදි. | තැපැල් දෙපාර්තමේන්තුවේ කොළඹ මධ්‍යම තැපැල් හුවමාරුවට අනුයුක්තව සේවය කරමින් සිටියදී සිදුවූ අක්‍රමිකතාවයක් සම්බන්ධව සිදු කර ඇති විනය පරීක්ෂණය හා දඬුවම් පැනවීමේ ක්‍රමවේදය | (අ) රාජ්‍ය නිලධාරීන් තමන් වෙත පැවරී ඇති වගකීම් නිසි පරිදි ඉටු කල යුතු බවටත්, රාජ්‍ය ආයතන පිළිබඳ ජනතා විශ්වාසය<br>(ආ) විනය නියෝගය ලබා දීමට හේතු පාදක | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශ යොමුව : MMI/AD2/16/10-vol -I | සාධාරණ නොවන බව සඳහන් කර ඇති පෙත්සම්කරු, තමා වෙත පනවන ලද දඬුවම් බල රහිත කිරීමට අවශ්‍ය කටුයතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | වූ විධිමත් විනය පරීක්ෂණයේ දී පෙත්සම්කරුට අසාධාරණයක් සිදුවී ඇති බව නිරීක්ෂණය නොවීම | |
| 60 | දොන් ගමගේ රූපසිංහ මහතා COM/PP/2025/257 ගරු අජිත් අගලකඩ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.10 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MMI/AD2/16/10-vol -I | වසර 40ක් පමණ නක්කල උප තැපැල් කාර්යාලයේ සේවය කළ බවත්, 2016.05.05 වන වැඩ තහනම් කළ බවත්, විනය පරීක්ෂණයකින් අනතුරුව නැවත සේවයේ පිහිටවීමෙන් පසුව කුමන්ත්‍රණකාරී ලෙස ලිපි තොගයක් සඟවා වරද පවරමින් 2017.03.02 දින යළිත් වැඩ තහනමකට ලක් කළ බවත්, එහි දී සිදු කළ විනය පරීක්ෂණය හරහා උපයා ගෙන තිබූ වැටුප් වර්ධක 5ක් විලම්භනය කර, ලැබීමට තිබූ වැටුප් වර්ධක 2ක් අහිමි කිරීමත් තමන් කාර්යාලය පිහිටි ඉඩමට අයුතු ලෙස ඇතුළු වූ බවට නඩු පවරා දඩයක් පැනවීමට ද කටයුතු කළ බවත්, මෙවන් අසාධාරණයන් සහ තම රෝගී තත්ත්වයන් මධ්‍යයේ රාජකාරි කිරීම අසීරු වූ බැවින් 2018.06.15 වන දින විශ්‍රාම ගත් බවත් සඳහන් කරන පෙත්සම්කරු, තමාට සිදු වූ බලවත් අසාධාරණය සලකා අහිමි කළ වැටුප් වර්ධක 7 සහ වැඩ තහනමට ලක් කර සිටි කාලයට අදාළ හිඟ වැටුප ලබා දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) පෙත්සම්කරු විසින් සිය රාජකාරීමය වගකීම වන තැපැල් භාණ්ඩ හා තැපැල් ලිපි බෙදා හැරීම අවස්ථා දෙකකදී (02) පැහැර හැර ඇති බවටත්, ඒ හේතුවෙන් සිය සේවාදායකයන්ව අගතියට පත් කර ඇති බව<br>(ආ) පළමු අවස්ථාවේ වැටුප් වර්ධක තුනක්ද (03) දෙවන අවස්ථාවේ වැටුප් වර්ධක දෙකක්ද (02) ලෙස වැටුප් වර්ධක පහක් (05) විලම්බනය කර ඇති බව පෙත්සමෙහි වැටුප් වර්ධක හතක් (07) විලම්බනය කර ඇති බව සඳහන් කර තිබීම නිවැරදි නොවන බව<br>(ඇ) පෙත්සම්කරු විසින් ඉදිරිපත් කළ කරුණු සාධාරණ සැකයකින් තොරව සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ප්‍රමාණවත් නොවන බව | ඉල්ලා ඇති සහන සඳහා හිමිකම නිර්දේශ නොකරයි |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **3) නිර්දේශ ලබා දීම කල් තබන ලද පෙත්සම්** | | | | |
| **ආරක්ෂක අමාත්‍යාංශය** | | | | |
| 61 | එච්. එල්. සමන්ත කුමාර මහතා COM/PP/2025/94 ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.14 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MOD/DEF/14/22/03 /PPC/08 දිනය : 2017.11.29 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සේවා කාලය වසර 11 මාස 10 ක් සම්පූර්ණ කර තිබියදී 2008.11.04 දින අසත්‍ය චෝදනාවක් මත “සේවය තවදුරටත් අවශ්‍ය නොවේ” යන වගන්තිය යටතේ ගුවන් හමුදා සේවයෙන් ඉවත් කරන ලද බවත්, ඒ වන විට යුද්ධයේදී ලැබූ තුවාල හේතුවෙන් ආබාධිත තත්ත්වයේ පසුවූ තමන්ට එල්ල කරන ලද චෝදනා සඳහා ස්වාධීන පරීක්ෂණයක් පවා නොපැවැත්වූ බවත්, නැවත රැකියාව ලබාගැනීමට දැරූ උත්සාහයන් ද අසාර්ථක වූ බවත් සාධාරණයක් ඉටුකිරීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | (අ) 2006.06.06 දිනැතිව පෙත්සම්කරු වෙත නිකුත් කරන ලද ලිපියෙහි පෙත්සම්කරු විසින් තම අත්සන යොදා නොමැති බවත් එවන් ලිපියක් නිකුත් කර ඇති බව පෙත්සම්කරු නොදැන සිටි බවටත් කල ප්‍රකාශය හේතුවෙන් එම අත්සන පෙත්සම්කරුගේ අත්සන ද යන්න තහවුරු කර ගැනීම සඳහා රජයේ රස පරීක්ෂක වෙත යොමු කිරීමට කාරක සභාව විසින් තීරණය කරන ලදි | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව නිරීක්ෂණයෙන් පසුව කාරක සභාවේ නිර්දේශ ලබා දීමට තීරණය කරන ලදි. |
| **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය** | | | | |
| 62 | එච්.කේ.පී.සී. ජයසිංහ මහත්මිය COM/PP/2025/15 ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.25 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : ED/05/152/05/2022/ 1-01 | විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුවද, කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොවීම නිසා ඊට අදාළ කඩඉම් සහන ලබා ගෙන අදාළ උසස් වීම සඳහා ඉදිරිපත් වන ලෙස තමන් හට දැන්වූ බවත්, තමන් විසින් ඒ සඳහා කඩඉම් සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු තමා වෙත කඩඉම් සහන ලැබුණු අතර අදාළ ලිපිය තමාගේ ලිපිගොනුවට ඇතුල් කිරීම සඳහා කාර්යාලය | ඉදිරිපත් කරුණු කරුණු සැලකිල්ලට ලක් කර අමාත්‍යාංශ වාර්තාවක් කැඳවන ලදි. | නිර්දේශ නිකුත් කිරීම කල් තබා ඇත |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | වෙත ලබාදුන් නමුත් මේ වන තෙක් එම උසස්වීම නොලැබුණු බවත් සඳහන් කරන පෙත්සම්කාරිය, තමාට 2015.12.07 වැනි දින ලැබීමට නියමිතව තිබූ විදුහල්පති සේවයේ 1 ශ්‍රේණිය ශ්‍රේණිගත කර එයට අදාළ වැටුපද ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ඇත. | | |
| 63 | ඒ. එල්. එම්. මුක්තාර් මහතා COM/PP/2025/60 ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.03 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ලිපි අංකය : ED/4/58/1/8/173/65 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අධිසේවක පදනම මත III පන්තියේ සැලසුම් තනතුරට පත් කළ බවත්, I පන්තියටද උසස් වීම් ලද බවත්, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 4/අධ්‍යාෂ/ආ/2/09 හා 1995.12.20 දිනැති ලිපිය මගින් අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට අතිරේක වැටුප් වර්ධක හතරක් ගෙවීමට තීරණය මත තමා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් 2022.11.05 දින වැටුප් වර්ධක හතරක් ඉල්ලූ නමුත් ලබා නොදුන් බවත්, 1998.12.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාන්තර හා දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ට වැටුප් වර්ධක හතරක් ගෙවීමට අවසර දී ඇති බවත්, සමාන්තර සේවාවක් වන ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා ව්‍යවස්ථාව අනුව 2009.06.20 දින සිට අධිසේවක පදනම මත පත්වීම් ලද නිලධාරීන්ට වැටුප් වර්ධක හතරක් ගෙවා ඇති බැවින් විමර්ශනයක් | | පෙත්සම්කරුගේ දැනුම්දීම මත ඔහුගේ සහභාගීත්වයෙන් තොරව මෙම පෙත්සම විමර්ශනය කළ නමුත් ඔහුගේ අදහස්ද විමසා නිර්දේශ ඉදිරිපත් කළ යුතු බවට තීරණය කරන ලද කාරක සභාව ඉදිරි දිනකදී මෙම පෙත්සම පෙත්සම්කරුගේද සහභාගීත්වයෙන් නැවත සලකා බැලිය යුතු බවට තීරණය කරන ලදි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | සිදුකර තමාට වැටුප් වර්ධක 04ක් ගෙවන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හා අධ්‍යාපන අමාත්‍යාංශයට නියෝග කරන ලෙස ඉල්ලා ඇත. | | |
| **මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය** | | | | |
| 64 | ආර්. ඒ. ප්‍රසන්න සමරසේකර මහතා COM/PP/2025/11 ගරු කෝසල නුවන් ජයවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.02.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව: 02/03/23/26/2022 දිනය : 2023.01.24 | විනය නියෝගයක් ලබා දීම හේතුවෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීමට තිබූ අවස්ථාව අහිමි වූ බැවින්, අදාල විනය නියෝගය සම්බන්ධයෙන් යම් සාධාරණ සහනයක්/ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. | (අ)විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා විනය නියෝග නිකුත් කර ඇති බව<br><br>(ආ) නමුත් සිද්ධියට සම්බන්ධ අනෙක් නිලධාරීන් නිදහස් කර ඇති බැවින් සහ පෙත්සම්කරු පමණක් වැරදිකරු වීම තුල පෙත්සම්කරුට අසාධාරණයක් සිදුව ඇති බව<br>(ඇ) ඉදිරිපත් කරන ලද අභියාචනා කාලාවරෝධය මත පදනම්ව ප්‍රතික්ශේප වී ඇති බවත් | සිද්ධියට සම්බන්ධ අනෙක් නිලධාරීන් නිදහස් කර පෙත්සම්කරු පමණක් වැරදිකරු කිරීම තුළින් පෙත්සම්කරු හට අසාධාරණයක් සිදුවී ඇති බැවින් සහනයක් ලබදීමේ හැකියාවක් පවතින්නේදැයි සොය බලා වාර්තාවක් එවන ලෙස දැනුම් දෙන ලද අතර අදාල වාර්තාව ලැබීමෙන් පසු කාරක සභාවේ නිර්දේශය ලබා දෙනු ලැබේ. |
| **රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය** | | | | |
| 65 | ඩබ්ලිව්. ඒ. ඒ. කේ. අජිත් වික්‍රමසිංහ මහතා COM/PP/2025/72 ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.11 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : PL/6/3/COM/PP/2019/2369 | 1981.08.03 දින සිට බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ව්‍යාපෘති සේවක තනතුරට බැඳුනු බවත්, 1991.03.13 දින සිට අභූත චෝදනා මත සිරගත කොට අධිකරණයේ ව්‍යාජ නඩු පැවරූ බවත්, 1994.10.19 සිට තමාව නිදහස් කළ බවත්, 1996.05.21 සිට නැවත සේවයේ පිහිටුවා, හිඟ වැටුප් ගෙවූ බවත්, සිරගත වූ | (අ) 2023.06.08 වන දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ දී සලකා බලන ලද කරුණු<br><br>(ආ) 2023.06.08 දින කාරක සභාවේ දැනුම්දීමට අනුව පෙත්සම්කරු විසින් 2023.06.09 දිනැතිව අදාළ ඉල්ලුම් පත්‍රය බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට | පෙත්සම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව හා ඔහු විසින් නම් සඳහන් කරන ලද ඔහුගේ සමකාලීන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුද අධ්‍යයනය කොට පෙත්සම්කරුට යථෝක්ත උසස් වීම ලබා දීමේ දී කිසියම් හෝ අසාධාරණයක් සිදුවී ඇත්දැයි යන්න නැවත පරීක්ෂා කිරීමට |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | කාලය තුළ කඩඉම් විභාග මගහැරුණු බවත්, 1996.08.23 එම විභාගයෙන් සමත් වූ බවත්, 1996.10.07 දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට නැවත අනුයුක්ත කළ බවත්, තමාට අදාළ කාලසීමාවන්හි ලැබිය යුතු උසස්වීම් ලබාදෙන ලෙස ඉල්ලුම් කළත්, ඒ සඳහා බස්නාහිර පළාත් සභාව වෙත පෙත්සම් ඉදිරිපත් කළත් සහනයක් නොවුණු බවත් අහිමි වූ උසස්වීම් ලබාදෙන, ඊට අනුරූපීව වැටුප් හා දීමනා සහ සිදුවූ අගතිය සම්බන්ධයෙන් සාධාරණ වන්දියක් ලබාදෙන ලෙසත්, ඉල්ලා ඇත. | යොමු කර ඇති බවත්, 2024.10.01 දින පැවති බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභා රැස්වීමේ දී 2004.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ව සංවර්ධන උපදේශක I ශ්‍රේණියට පෙත්සම්කාර වික්‍රමසිංහ මහතා උසස් කිරීම අනුමත කර ඇති අතර එකී තීරණය 2024.11.12 දින බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පෙත්සම්කරු වෙත දන්වා යවා ඇති බව | කටයුතු කොට ඒ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙස බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ වෙත කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>අදාල වාර්තාව නිරීක්ෂණයෙන් අනතුරුව කාරක සභාව නිර්දේශ ලබාදෙනු ඇත. |
| 66 | එස්.එම්.විරාජ් කුමාර සමරවීර මහතා COM/PP/2025/24 ගරු ඊ. එම්. බස්නායක මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MPA/PSD/Sab (වෙළුම II) | 1999 වර්ෂයේ සේවයට බැඳී දැනට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව ක්‍රමසම්පාදන හා සැලසුම් විෂයට සම්බන්ධ රාජකාරි ඉටු කරන බවත්, 2009.04.19 වන දින පැවති ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට (අධි සේවක පදනම මත) බඳවා ගැනීමේ පරීක්ෂණය සමත්ව ඊට අදාළ බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි බවත්, බඳවා ගැනීමේදී අසාධාරණ හා පදනම් විරහිතව උක්ත පත්වීම ලබා දුන් බවත්, මෙම පත්වීම් ලබාගත් නිලධාරීන් පිරිස හා සමානව සුදුසුකම් සපුරා තිබූ තමා ඇතුළු පිරිසකට අදාළ උසස්වීම් ලබා නොදීමට | | මෙම පෙත්සම සම්බන්ධයෙන් වැඩිදුරටත් විමර්ශනය කිරීමට කාරක සභාව තීරණය කරන ලදි. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | කටයුතු කර තිබූ බවත් සඳහන් කරන පෙත්සම්කරු, සාධාරණ විසඳුමක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇත. | | |
| 67 | ජී.එච්.ඩී. ජගත් පණ්ඩිත මහතා COM/PP/2025/205 ගරු නිශාන්ත සමරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.20 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : ES/DIR/J/9(II) | 2020 වසරේදී ශ්‍රී ලංකා ඉංජිනේරු III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්කර 2021 වසරේ සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වුවද එම තනතුර නොලද බවත්, තමා පෙනී සිටි සිවිල් කාණ්ඩය යටතේ දකුණු පළාතට තනතුරු ලබා දී නොමැති බවත්, බඳවා ගැනීම් සුදුසුකම්( 4.1.4 හා 4.1.6) සපුරා ඇති බැවින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත අදාළ පත්වීම ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | | මෙම පෙත්සම සම්බන්ධයෙන් වැඩිදුරටත් විමර්ශනය කිරීමට කාරක සභාව තීරණය කරන ලදි. |
| **මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | | | |
| 68 | ඩී.එම්.ආර්. රාජසිංහ මහතා COM/PP/2025/56 ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.04.08 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MF1/11/03/11/08/COPP/GEN | තමා 2010.09.02 දින සිට කළමනාකරණ සහකාරවරයෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 10 ක් පමණ සේවය කළ බවත්, හදිසියේ ඇතිවූ අසනීප තත්වයක් හේතුවෙන් 2019 වසරේ මැද භාගයේ සිට සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බවත්, නැවත සේවය ඉල්ලා ශ්‍රී ලංකා මහ බැංකුවට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, සානුකම්පිතව සලකා බලා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටී. | (අ) නැවත සේවයට බඳවාගැනීම සඳහා ඔහුගේ සේවා යෝග්‍යතාව වෛද්‍ය මණ්ඩලයක් හමුවේ පරීක්ෂාවට ලක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලස්වන ලෙසත්<br>(ආ) අභ්‍යන්තර විනය පරීක්ෂණ කටයුතු ද නැවත ආරම්භ කරන ලෙසටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත් අංශයේ අධ්‍යක්ෂ වෙත නිර්දේශ කරන ලද අතර එම වාර්තාව මාස 6 ක් තුල කාරක | අදාල වාර්තාව විමර්ශනය කිරීමෙන් අනතුරුව කාරක සභාවේ නිර්දේශය නිකුත් කරනු ලැබේ. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| | | | සභාව වෙත යොමු කරන ලෙස | |
| **ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය** | | | | |
| 69 | පී. සංජීව ප්‍රසාද් ප්‍රනාන්දු මහතා COM/PP/2025/87 ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.03.19 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MWCA&SE/ADM/ 05/02 -2023 දිනය : 2023.07.18 | සමෘද්ධි සංවර්ධන නිලධාරියකු ලෙස සේවය කරමින් සිටියදී 2011.06.01 දින දුරකථන ඇමතුමක් මගින් විධිමත්ව දන්වා සේවයට වාර්තා නොකිරීම පදනම් කර සේවය හැර ගිය සේ සලකා කටයුතු කළ නමුත් බලධාරීන්ට සහ කම්කරු විනිශ්චය සභාවට සිදු කළ ඉල්ලීම්වලින් ද ඵලක් නොවූ බවත්, 2017.03.03 දින කම්කරු විනිශ්වය සභා විනිසුරු විසින් 2013 අංක 1 දරණ දිවි නැගුම පනත යටතේ සමෘද්ධි අධිකාරියට එරෙහිව පැවති නඩු නිෂ්ප්‍රභ කළ බවත්, රාජ්‍ය සේවයේ පරිපාලනමය වශයෙන් පළිගැනීමකට ලක්වූවන්ට සහන සැලසීමේ කමිටුවට කල අභියාචනය සමෘද්ධි දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් සමෘද්ධි අධිකාරියක්ව පවැති අවධියේ සිදුවීමක් බැවින් දෙපාර්තමේන්තුවක් වූ පසු සැලකීමට නොහැකි බව දැන්වූ බවද සඳහන් කරන අතර සේවය අතහැර ගියා සේ සලකන දිනයේ සිට සියලුම වරප්‍රසාද හිඟ වැටුප් සහ දීමනා සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ඇත. | (අ) සවිස්තර වාර්තාවක් කාරක සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය වෙත නියම කරන ලදී.<br>(ආ) පෙත්සම්කරු හට ද තමාගේ නිර්දෝෂී භාවය ඔප්පු කිරීමට යම් සාක්ෂි පවතී නම් ඒවා සියල්ල සහතික කරන ලද පිටපත් සහිතව කාරක සභාවට ලිපියක් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලෙස ද කාරක සභාව විසින් තවදුරටත් නියම කරන ලදී. | ඉදිරියේ දී එළැඹෙන කාරක සභාවක දී පෙත්සම නැවත විමර්ශනය කිරීමට කාරක සභාව විසින් තීරණය කරන ලද අතර ඒ සඳහා දැනට කැඳවා ඇති නිලධාරීන්ට අමතරව දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් ද කැඳවිය යුතුයැයි ද තීරණය කරන ලදී. |

| අනු අංකය | පෙත්සම සම්බන්ධ තොරතුරු | අපේක්ෂිත සහනය | කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු | කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| **ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය** | | | | |
| 70 | ජී. ඩබ්ලිව්. ලාල් අමරසිරි මහතා COM/PP/2025/183 ගරු පද්මසිරි බණ්ඩාර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කර ඇත. 2025.05.22 දින විමර්ශනය කරන ලදි. අමාත්‍යාංශ යොමුව : MTCA/10/1/3/47 දිනය : 2016.12.30 | 1980 වසරේ සිට දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කල බවත්, 1995.02.22 දින සිට 2013.11.12 දින දක්වා කට්ටිභාරකරු තනතුරේ සේවය කල බවත්, 1998 වර්ෂය දක්වා කට්ටිභාරකරුට හිමි සියලුම වැටුප් හා වරප්‍රසාද තමාට ලබාදී ඇති නමුත් කාර්යාල ලිපිකරුවන් මගින් ඇතිවූ ලිඛිත දෝෂයක් හේතුවෙන් තම වැටුප හා නිල නාමය අහිමි වී කලින් පැවති තනතුරෙන් විශ්‍රාම ගන්වන ලද බවත් සඳහන් කරන පෙත්සම්කරු වසර 18ක් මෙම ගැටළුව නොවිසඳී ඇති බැවින් තම තනතුර හා නිල නාමය ලබාදී ඊට අදාළ විශ්‍රාම වැටුප සකසන ලෙස පෙත්සමෙන් ඉල්ලා ඇත. | පෙත්සම්කරු වසර 18 ක් කට්ටිභාරකරු තනතුරේ වැඩ බලන ලද බවට පෙත්සම්කරු විසින් දිගින් දිගටම කරුණු ඉදිරිපත් කල බැවින් එම වසර 18 ක කාලය තුළ ඉටු කළ සේවය පිළිබඳව පැහැදිළි කිරීමක් සහිතව සේවය කළ සේවා ස්ථාන සහ එම කාලය තුළ පත්ව සිටි අධීක්ෂණ නිලධාරීන්ගේ නම් සහ තනතුරු යන විස්තර ද අඩංගු ආවරණ ලිපියක් සමඟින්, තමා හට කට්ටිභාරකරු ලෙස ආමන්ත්‍රණය කරන ලද ලිපි ලේඛණ ඔහු සතුව පවතී නම් ඒවායේ තමන් විසින්ම සහතික කරන ලද පිටපත් ද අමුණා, තමා වසර 18 ක කාලයක් කට්ටිභාරකරු ලෙස සේවය කළ බවට පවතින සියළු සාක්ෂි පිටපත් කාරක සභාවේ පරීක්ෂාව පිණිස මසක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් පෙත්සම්කරු හට නියම කරන ලදී. | අදාල ලිපි ලේඛන ලැබීමෙන් අනතුරුව නිර්දේශයක් ප්‍රකාශ කිරීමට කාරක සභාව තීරණය කරන ලදි. |

**ඇමුණුම II**

# ආදර්ශ පෙත්සමක ආකෘතිය

***"ගරු කථානායකතුමනි,***
***මෙම පෙත්සම ඉදිරිපත් කරමි."***

----------------------------------------

ඉදිරිපත් කරන මන්ත්‍රීතුමාගේ අත්සන, දිනය හා නිල මුද්‍රාව

**පෙත්සම්කරුගේ සම්පූර්ණ නම :**
**පදිංචි ලිපිනය : ( කාර්යාලයීය ලිපිනය නොවේ)**
**ජාතික හැඳුනුම්පත් අංකය :**
**ස්ථාවර දුරකථන අංකය :**
**ජංගම දුරකථන අංකය :**
**වෙනත් :**
**දිනය :**

ගරු කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

ගරු කථානායකතුමනි,

**(ශිර්ෂය)** සිදුව ඇති ආසාධාරණය, බලාපොරොත්තු වන විසඳුම හැඟවෙන මාතෘකාවක් කෙටියෙන් විය යුතුය)

**(සිදුව ඇති ආසාධාරණය)**

සිදුවීමට අදාළ කරුණු පැහැදිලිව, දින වකවානු සහිතව, එම සිදුවීම සහ අගතියට පත් පුද්ගලයා පිළිබඳව අදාළ ආයතනයට හෝ අමාත්‍යාංශයට පහසුවෙන් කරුණු සොයා ගත හැකි වන ආකාරයට අත්‍යවශ්‍ය හා වැදගත් කරුණු පමණක් ගෞරවාන්විත භාෂාවෙන් ඉදිරිපත් කළ යුතුය. අදාළ නොවන ප්‍රකාශ එහි අන්තර්ගත නොවිය යුතු අතර, එයට කවර හෝ ලිපි, ලේඛන හෝ ඒවායේ පිටපත් අමුණා නොතිබිය යුතුය.

**(අපේක්ෂිත සහනය )**

ඉල්ලා සිටින සහනය කුමක් ද යන්න නිශ්චිතව සඳහන් කළ යුතුය.

**(පෙත්සම්කරුගේ අත්සන )** _________________________________

<u>පෙත්සම්කරුගේ අත්සන/ මහපට ඇඟිලි සලකුණ</u> (ලිවීමට නොහැකි කෙනෙකු විසින් සාක්ෂිකරුවකු ඉදිරියේ තම ඇඟිලි සළකුණ තැබිය යුතුය)

**Comment 1:** මෙම සටහන වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් පෙත්සමේ ම ඉහළින් සටහන් කොට අත්සන් තැබිය යුතුය. (පෙත්සම මන්ත්‍රීතුමාගේ ආවරණ ලිපියක් සහිතව ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් නොවේ)

**Comment 2:** උදා:- දිසානායක මුදියන්සේලාගේ පද්ම බණ්ඩාර

**Comment 3:** උදා:- 65/5, පිළියන්දල පාර, මහරගම

**Comment 4:** මෙම පෙත්සමෙන් ඉල්ලා සිටින සහනයට අදාළව, මෙයට පෙර පෙත්සමක් ඉදිරිපත් කර තිබේ නම් එම පෙත්සමේ අංකය ඇතුළත් කිරීම වඩාත් සුදුසුය.

**Comment 5:** විධිමත් ලෙස නිවාඩු ලබා සිටිය දී අහිමි කළ මාගේ රැකියාව නැවත ලබා ගැනීම

**Comment 6:** උදා:- දිසානායක මුදියන්සේලාගේ පද්ම බණ්ඩාර වන මම 2015.01.01 දින ආධුනික උප පොලිස් කොස්තාපල්වරයකු වශයෙන්(සො.කො. 147xx) ශ්‍රී ලංකා පොලිසියට බැඳී මහරගම පොලිසියේ සේවය කරමින් සිටිය දී 2019.05.30 දින තදබල ලෙස අසනීප වීම නිසා විධිමත් ලෙස දින 02 කට නිවාඩු අයදුම් කර සේවා ස්ථානයෙන් බැහැර වූයෙමි. එහෙත් අසනීප තත්ත්වය උග්‍ර වීම නිසා කළුබෝවිල ශික්ෂණ රෝහලේ සති 03ක කාලයක් නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමට සිදු විය. මම රෝහල්ගතව සිටින බව විදුලි පණිවුඩයක් මගින් 2019.06.02 වන දින සේවා ස්ථානය දැනුවත් කළෙමි. එහෙත් 2019.06.15 දිනැති ලිපියෙන් 2019.06.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මා වෙත (නොදන්වා සේවයට වාර්තා නොකළ බව සඳහන් කර) සේවය හැර යාමේ නියෝගය නිකුත් කර ඇත. විදුලි පණිවිඩුඩයේ ලදුපත, වෛද්‍ය වාර්තාවල පිටපත් හා අනෙකුත් අදාළ ලිපි ලේඛන අවශ්‍ය විටක දී ඉදිරිපත් කළ හැක.

**Comment 7:** ගරු කථානායකතුමනි, මේ පිළිබඳව සොයා බලා මා හට නැවත රැකියාව ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ගෞරවයෙන් ආයාචනා කර සිටිමි. (මෙහි දී සාධාරණය ඉටු කර දෙන ලෙස හෝ සහනයක් ලබාදෙන ලෙස පමණක් සඳහන් නොකර බලාපොරොත්තු වන සහනය, ඉහත උදාහරණයේ දැක්වෙන පරිදි නිශ්චිතවම සඳහන් කළ යුතුය)